
# සාරාංශය

# සමාජ-දේශපාලන යථාර්ථයන්
# 1. හිල්ටන් හෝටලයේ මගඩිය

***Amazon Books –*** ***[‘Socio-Political Realities - Hilton Hotel Fiasco & Ad hominem Legislation - Expropriation Law’]***

***http://www.consultants21.com/page-1-derivative-actions-in-law.php***



*විශාලත්වය- 8.25” X 11” - පිටු ගණන 818*

මෙම ග්‍රන්ථය කර්තෘ ඉදිරිපත් කරන්නේ කොටස් දෙකකින් සමන්විතවය. පළමුවන කොටසේ ප්‍රධාන මාතෘකාව වන්නේ හිල්ටන් හෝටලයේ මගඩිය සම්බන්ධ කරුණු සහ ක්‍රියාදාමයන් පදනම් කර ගනිමින්, සමාජ-දේශපාලන යථාර්ථයන් පිළිබඳව සාරාංශ සහිතව කෙරෙන හෙළිදරව් කිරීමකි.

1983 වර්ෂයේ ඉතාමත් ම්ලේච්ඡ ‘කළු ජූලි’ කෝලාහලයට පසු, එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ප්‍රතිරූපය දැඩි ලෙස විවේචනයට ලක්වීම නතර කිරීමට සහ ශ්‍රී ලංකාවේ නාමය නැවත කීර්තිමත් තත්වයකට නැංවීම උදෙසා, එවකට ජනාධිපති ජේ. අර්. ජයවර්ධන ප්‍රමුඛ ආණ්ඩුව වහාම පියවර ගෙන ක්‍රියාත්මක වෙමින්, එවකට සැලසුම් අදියරෙහි පැවති කොළඹ හිල්ටන් හෝටල් ව්‍යාපෘතිය සංවර්ධනය කර ස්ථාපිත කිරීමට උනන්දුව සහ අනුග්‍රහය දැක්විය. මෙම හිල්ටන් හෝටල් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද්දේ කොළඹ හිල්ටන් හෝටලය හිමි සමාගම වූ හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) (HDL) සමාගම විසිනි.

එම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රධන අභිප්‍රේරණයක් වූයේ, ජපානයේ පිළිගත් විශාල සමාගම් දෙකක් වූ මිට්සුයි සහ සමාගම සහ තායිසෙයි සමාගමේ මැදිහත් වීම සහ ඇමරිකා එක්සත් ජනපද හිල්ටන් ඉන්ටර්නැෂනල් හෝටල් ජාලය එම ව්‍යාපෘතියට සම්බන්ධ වී සිටිමත්; සහ එම නිසා ඇමරිකා එක්සත් ජනපදයේ සහ ජපානයේ සහභාගිත්වය එම

අවස්ථාවේදී සහයෝගිව මෙම ව්‍යාපෘතියට ආයෝජනය කිරීම මත, ශ්‍රී ලංකාව තුල ජාත්‍යන්තරයේ විශ්වාසය ඇතිවේය යන අභිලාශයෙනි. හිල්ටන් හෝටලය සඳහා ගෘහ නිර්මාණ ශිල්පීන් ලෙස කටයුතු කලේ ජපානයේ සුප්‍රකට ගෘහ නිර්මාණ ශිල්පීන් වන කැන්කෝ කිකාකු සෙක්කෙෂියා යොෂෝ ෂිබාටා සමාගමයි.

ඒ අනුව, හිල්ටන් හෝටල් ව්‍යාපෘතිය ඉදි කිරිමේදී, රජයේ ඇපකර මත, විදේශ ණය ලබා ගැනීමට සහ ආනයනය කරන සියලු භාණ්ඩ තීරුබදු වලින් නිදහස් කිරීමටද ජනාධිපති ජේ. අර්. ජයවර්ධනගේ දායකත්වය මත කටයුතු කෙරුණි. එසේම අගමැති ආර්. ප්‍රේමදාසද හිල්ටන් හෝටල් ව්‍යාපෘතිය ඉදි කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය මගින් පොලි රහිතව, වර්ෂ 30ක් තුල බදු වාරිකය කොටස් වශයෙන් ගෙවීමට හැකි වන පරිදි කොළඹ නගරයේ කේන්ද්‍ර ස්ථානකින් අක්කර 7ක ඉඩමක් අවුරුදු 99ක කල් බදු පදනම මත බදු දීමට සලස්වා ලබා දෙන ලදී.

කර්තෘ විසින් මෙම පළමු ග්‍රන්ථ 3 හි විස්තර කර ඇත්තේ, මෙම ජපන් සමාගම් විසින් හිල්ටන් හෝටල් ව්‍යාපෘතිය ඉදිකිරීමේදී, ශ්‍රී ලංකා රජයට දැවැන්ත මහා පරිමාණ වංචාවක් කිරීමට තැත් කළ උත්සාහයක් පිළිබඳව විස්තර සහ කර්තෘ විසින් එය විමර්ශනය කොට, ශ්‍රී ලංකාවේ පළමු වරට ව්‍යුත්පන්න නඩුවක් ගොනු කරමින් එම මහා පරිමාණ වංචාව වළක්වාලීමට ගෙන තිබූ ක්‍රියා පටිපාටිය සවිස්තරාත්මක ලෙස එළිදරව් කිරීමකි.

එම නිසා මේ පොතේ මුල් කොටස වන 'හිල්ටන් හෝටලයේ මගඩිය' හි අන්තර්ගතය අවබෝධ කර ගැනීමට, එම මහා පරිමාණ වංචාව සම්බන්ධයෙන් කර්තෘ විසින් රචිත ප්‍රථම ග්‍රන්ථ 3 හි අඩංගු කරුණු කාරණා සම්බන්ධයෙන්ද අවබෝධයක් ලබා ගෙන තේරුම් ගැනීම අත්‍යවශ්‍ය වේ. එනම් *'Colombo Hilton Hotel Construction - Fraud on Sri Lanka Government – Vol. 1 – Sri Lanka's First Derivative Action in Law' - 'Colombo Hilton Hotel Construction - Fraud on Sri Lanka Government - Vol. 2 - Criminality Exposed, but Perversely Covered-up' – 'Colombo Hilton Hotel Construction - Fraud on Sri Lanka Government Vol. 3 - Settlement of a Fraud'*

මෙවැනි දැවැන්ත මහා පරිමාණ වංචාවක් සිදුකිරීම මගින් විශාල විදේශීය විනිමයක් වංචනික ලෙස මෙරටින් බැහැර කිරීමට ඉහත කී ජපන් සමාගම් කූට ලෙස උත්සාහ දරණ ලද්දේ, ඔවුන් වෙත ශ්‍රී ලංකා රජය විසින් ලබා දී තිබූ රජයේ ඇපකර මතය.

ඉහත කරුණු දැනගත් විගසම, කර්තෘ විසින් වහාම විමර්ශනයන් සිදු කරමින් කොළඹ දිස්ත්‍රික් අධිකරණයේ ඉහත කී නඩුව ගොනු කිරීම මත, කොළඹ දිස්ත්‍රික් අධිකරණය විසින්, ජපන් සමාගම් වලට HDL සමාගම විසින් සහ / හෝ ශ්‍රී ලංකා රජයෙන්, රජයේ ඇපකර මත, කිසිදු ගෙවීමක් නොකරන ලෙසට  වහාම වාරණ නියෝග පනවන ලදී. එවැනි තත්වයක් යටතේ, ඉහත කී එම ශ්‍රී ලංකා රජයේ ඇපකර සැබවින්ම ශුන්‍ය හා බලරහිත හා නීතිය ඉදිරියේ කිසිදු නීතියමය බලයක් නොමැති බවට පත්වීම සිදුවේ.

කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ ජපන් තානාපති විසින් යොදන ලද රාජ්‍ය තාන්ත්‍රික පීඩන හමුවේ, භාණ්ඩාගාර ලේකම් ආර්. පාස්කරලිංගම් යථාර්ථය අවබෝධ කර ගෙන, එහි සටහනක් තබන ලද්දේ *'මෙය අධ්‍යයනය කරන්න. මෙමගින් අපගේ ආධාර වලට බලපෑමක් ඇතිවිය හැකි බව ජපාන තානාපති මට දැනුම් දුන්නායි'* යනුවෙනි.

**"ලිපි ශීර්ෂය**
**ද සිල්වා සහ පෙරේරා**

<u>ලියාපදිංචි තැපෑල</u>                                        1991 නොවැම්බර් 12

ගරු. සුනිල් ද සිල්වා, ජනාධිපති නීතිඥ
නීතිපති
නීතිපති දෙපාර්තමේන්තුව
හල්ෆ්ඩොප් මාවත
කොළඹ 12

ගරු. මහතාණනි,

**<u>ඩී. සී. කොළඹ නඩු අංක 3155/ විශේෂිත</u>**

අපගේ කලින් සිදු කල ලිපි ගනුදෙනුවට අදාළව ක්‍රියාවෙහි යෙදීම සම්බන්ධයෙන් ලියා දන්වමි.  ඉහත ක්‍රියාවට අදාළව  91.10.28 දිනැතිව උගත් දිස්ත්‍රික් විනිසුරු විසින් සිදු කල නියෝගයේ පිටපත් සහ ඒ අනුව 1 වන, 2 වන, 3 වන සහ 4 වන විත්තිකරුවන්ට එරෙහිව ලබා දුන් අතුරු තහනම් නියෝගයන්හි පිටපත් මේ සමඟ අමුණා එවමි.

ඔබ විසින්, උගත් දිස්ත්‍රික් විනිසුරුගේ නියෝගයෙහි අන්තර්ගතය පිළිබඳව, විශේෂයෙන්, වංචාකාරී කුමන්ත්‍රණය පිළිබඳ කාරණාව සම්බන්ධව ඔබගේ අවධානය යොමු කරනු ඇතැයිද, සහ බැලූ බැල්මට, අධිකරණය විසින් වංචා අවස්ථාව පිළිබඳ සංඥේයත්වය ගනු ලබන බැවින්, ඔබ විසින් ඒ අනුව,  ශ්‍රී ලංකාවේ මහජනතාවගේ යහපත උදෙසා ගැටලුකාරී රජයේ ඇපකරයන් සම්බන්ධයෙන් පියවර ගනු ඇතැයිද, සහ එවැනි වංචා සහගත තත්වයක් යටතේ, නීතිය ඉදිරියේ එවැනි රජයේ ඇපකරයන් ශුන්‍ය සහ බල රහිත බව අදාළ පාර්ශවයන් වෙත දැනුම් දීමට කටයුතු කරනු ඇතැයිද අප විශ්වාස කරමු.

එසේම ඔබ විසින්, ජපානයේ එක්සිම් බැංකුව සහ වෙනත් දන්නා එකී ණය සඳහා සම්බන්ධිත මූල්‍ය සම්පාදකයින් වෙත ඒ අනුව දැනුම් දීමට සළකා බලන ලෙසද දන්වමු. එසේම අපගේ 90.09.26 දිනැති ලිපිය කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරනු ලබන අතර,  ඒ සම්බන්ධයෙන් ඔබ විසින් සුදුසු ක්‍රියාමාර්ග ගනු ඇතැයි විශ්වාස කරන්නෙමු.

කරුණාකර ලිපිය ලද බව දන්වන්න.

ඔබගේ හිතවත්

*(අත්සන)*
*නීතිඥ*

පිටපත : ලේකම්, මුදල් අමාත්‍යාංශය සහ ලේකම්, මහාභාණ්ඩාගාරය"

එවකට දකුණේ ජනතා විමුක්ති පෙරමුණේ ත්‍රස්තවාදය සාර්ථක ලෙස මර්ධනය කළ ඉතා ප්‍රබල සහ ශක්තිමත් ඇමතිවරයෙකුව සිටි රාජ්‍ය ආරක්ෂක අමාත්‍ය රන්ජන් විජේරත්නගේ දිරි ගැන්වීම, කර්තෘට ඔහුගේ මෙම කටයුතු වලදී ඉමහත් ශක්තියක් වූ අතර, ශ්‍රී ලංකා රජයට සහ මහජනතාවට සිදුකළ මහා පරිමාණ වංචාවා වැලැක්වීමට කර්තෘ විසින් ගොනු කළ පළමු නීතිමය පියවර පිළිබඳව, ඔහු විසින් ජනාධිපති ආර්. ප්‍රේමදාස ඇතුළු ශ්‍රී ලංකා රජයේ අමාත්‍ය මණ්ඩලය එම අවස්ථාවේදීම දැනුවත් කර ඇත. එනම්:

**"ලිපි ශීර්ෂය**
**රන්ජන් විජේරත්න, පි.ම.**
**වැවිලි කර්මාන්ත අමාත්‍ය**

1990 නොවැම්බර් 15 දින

අතිගරු ආර්. ප්‍රේමදාස
ශ්‍රී ලංකා ජනාධිපති
ජනාධිපති ලේකම් කාර්යාලය
කොළඹ 1

**රහසිගතයි**

අතිගරු ජනාධිපතිතුමනි,

**හිල්ටන් හෝටලය**

1990 නොවැම්බර් 14 වන බදාදා දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී මා විසින් සිදු කරනු ලැබූ විවේචනයන්ට වැඩිමනත් ලෙස, කොන්ත්‍රාත්කරුවන්ට / ගෘහනිර්මාණ ශිල්පීන්ට එරෙහිව තහනම් නියෝගයක් ගොනු කරනු ලැබූ, නිහාල් අමරසේකර මහතා විසින් 1990 නොවැම්බර් 14 වන දිනැතිව මා වෙත එවනු ලැබූ ලිපියේ පිටපතක්, ඒ සමග අමුණා එවනු ලැබූ ලේඛනයන්ද සමඟ, අතිගරු ජනාධිපතිතුමාගේ දැනගැනීම සඳහා, මේ සමඟ අමුණා ඉදිරිපත් කරමි.

ඔබගේ විශ්වාසී,

*(අත්සන)*
රන්ජන් විජේරත්න
වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ
ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය"

"ලිපි ශීර්ෂය
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

නිහාල් ශ්‍රී අමරසේකර
කමින්ඩ්ටැක්ස් මැනේජ්මන්ට් සර්විසස් ලිමිටඩ්
167/4, ශ්‍රී විපුලසේන මාවත
කොළඹ 10

හිතවත් නිහාල්,

1990 නොවැම්බර් 14 වන දිනැතිව ඔබ විසින් එවනු ලැබූ ලිපිය සහ ඒ හා සම්බන්ධිත ලේඛන මා වෙත ලද බව දන්වමි.

මා විසින්, මෙම කරුණ සම්බන්ධයෙන් 1990 නොවැම්බර් 14 වන දිනැති අමාත්‍ය මණ්ඩලයේදී මතු කර දැක්වූ අතර, අතිගරු ජනාධිපති තුමා වෙත ඔබගේ ලිපිය සහ ඒ සමඟ අමුණා තිබූ ලේඛනයන්හි පිටපතක් යොමු කලෙමි.

*(අත්සන)*
රන්ජන් විජේරත්න
වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ
ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය"

ඒ අනුව, ජනාධිපති ආර්. ප්‍රේමදාසගේ ආර්ථික උපදේශක වූ සී. ගුණසිංහම් විසින් කොළඹ දිසා අධිකරණයේ කර්තෘ විසින් ගොනු කළ නඩුව සහ දිසා අධිකරණය දුන් වාරණ නියෝග වල සත්‍ය කරුණු අවබෝධ කර ගෙන තේරුම් ගැනීමට සහ කොළඹ දිස්ත්‍රික් අධිකරණය විසින් HDL සමාගම විසින් සහ / හෝ ශ්‍රී ලංකා රජයෙන්, රජයේ ඇපකර මත, මෙම ජපන් සමාගම් වලට කිසිදු ගෙවීමක් නොකරන ලෙසට සිදු කල වැලැක්වීම යන කරුණු කීපයක් සම්බන්ධයෙන් දීර්ඝ සාකච්ඡාවක් සඳහා කර්තෘ කැඳවා තිබුණි.

එහි ප්‍රතිඵලයක් ලෙස ජනාධිපති ආර්. ප්‍රේමදාස දැනුවත් කරනු ලැබ, ඔහු විසින් ජනාධිපති ලේකම් කේ.එච්.ජේ. විජේදාස මගින්, භාණ්ඩාගාර ලේකම් ආර්. පාස්කරලිංගම් වෙත පහත සදහන් ලිපිය මගින් උපදෙස් ලබා දෙමින් නියෝග කරන ලද්දේ, වහාම *රජය මැදිහත් වී, මේ දැවැන්ත මහා පරිමාණ වංචාවට එරෙහිව ක්‍රියා කිරීමට පියවර ගත යුතු බවටත්*, එම වගකීම හිල්ටන් ව්‍යාපෘතියේ *සුළුතර කොටස්කරුවෙකු වූ කර්තෘ මත පමණක් තැබීමෙන්*, රජය මේ සම්බන්ධයෙන් ක්‍රියා නොකළේ මන්ද යන ප්‍රශ්නය මතුවේ යයි ප්‍රකාශ කරමිනි.

**"ලිපි ශීර්ෂය**
**ජනාධිපති ලේකම් කාර්යාලය**

1990 දෙසැම්බර් 17

ආර්. පාස්කරලිංගම් මහතා
මුදල් අමාත්‍යාංශ ලේකම්

<u>හිල්ටන් හෝටලය</u>

උක්ත කරුණ සම්බන්ධයෙන්, වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය රන්ජන් විජේරත්න විසින් අතිගරු ජනාධිපති තුමා වෙත එවනු ලැබූ 1990 නොවැම්බර් 15 වන දිනැති ලිපියේ පිටපතක් මේ සමඟ ඔබ වෙත යොමු කරමි.

එසේම, ගරු. අමාත්‍යතුමා විසින් එවනු ලැබූ, නිහාල් අමරසේකර මහතාගේ 1990 නොවැම්බර් 14 දිනැති ලිපිය සහ ඒ සමඟ ඇතුලත් කරනු ලැබ තිබූ ඇමුණුම්ද, මේ සමඟ ඔබ වෙත යොමු කරමි.

මෙම කරුණ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපති ඉදිරියේ තබනු ලැබූ සළකා බැලීම් කිහිපයක් සම්බන්ධයෙන් මා විසින්, ඔබගේ අවධානයට යොමු කල යුතු වේ.

එක් කරුණක් නම්, මෙම කරුණ ආරම්භයේ සිටම විනිශ්චයට භාජනය වී ඇති බැවින්, මේ වනතෙක් මහජන අවධානය විවෘතව ප්‍රකාශ කරනු ලැබ නොමැත. අනෙක් කරුණ නම්, දිස්ත්‍රික් අධිකරණය විසින් වංචාවක් සිදුවී ඇති බවට නිශ්චයක් ලබා දුනහොත්, සමාගමේ ඉහළ කොටස් ප්‍රමාණයක් සතුවන රජය විසින්ම එකී නීතිමය පියවර නොගත්තේ මන්ද යන ප්‍රශ්නය අසනු ඇත. අධිකරණය විසින් ක්‍රියාමාර්ග ගැනීමෙන් පසුව, මෙම කරුණ සම්බන්ධයෙන් නඩු කීමට සමාගමේ කොටස්කරුවන් වෙත සහ මහජනතාව වෙතපවතින මූලික වගකීම සිදු කිරීමෙන් සමාගම ඈත්ව සිටින්නේ මන්ද යන වැඩිදුර ප්‍රශ්නයක් වනු ඇත. මෙමගින් මතුවන පරිදි, වංචාකාරී ගනුදෙනුවකට ගෙවීම සඳහා මහජන අරමුදල්උපයෝගී කර ගැනීම වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට සුළුතර කොටස්කරුවකුට කටයුතු කිරීමට ඉඩ හැර සිටියේ මන්දයනුවෙන් විමසිය හැකි වේ. ජපාන සමාගම් විසින් රජයේ ඇපකරුවන් කැඳවා තිබේ නම්, ප්‍රතිඵලය මෙය වනු ඇත.

මෙම කරුණ සම්බන්ධයෙන් ජපාන රජයේ සංවේදීතාවයට අදාළව, ජපන් සමාගම් සහ රජයේ උසස් පුද්ගලයින් සම්බන්ධ වෙමින්, මෙම වංචාව මත ජපානය තුළ පවතින මහජන සැළකීම, අවධානය වර්ධනය වෙමින් පවතින බව නිරීක්ෂණය කෙරේ. ජපාන රජය එබැවින්, කිසිදු ලෙසකින්, විදේශයන්හි වංචා සඳහා සම්බන්ධ වීමට ජපාන සමාගම් වෙත පහසුව ලබා දීම දැකීමට ප්‍රිය නොවේ.

මෙම සැළකිලිමත් කරුණු මතුයෙහිදී, දැනට සිදු කෙරෙමින් පවතින අධිකරණය කටයුතු වලට අදාළව, රජයේ ස්ථාවරය අමාත්‍ය මණ්ඩලයේදී ප්‍රශ්න කිරීමට කටයුතු කරන ලෙසට අතිගරු ජනාධිපති විසින් ඔබ වෙත නියෝග කරනු ලැබ ඇත.

අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් කෙරෙහි ඔබගේ අවධානය යොමු කළ හැකි නම් මා අගය කරමි.

*(අත්සන)*
කේ. එච්. ජේ. විජයදාස
ජනාධිපති ලේකම්"

එම දිනයේදීම, එනම් 1991.11.21 දින පැමිණිලිකාර කර්තෘගේ නීතිඥවරුන් විසින් පහත සඳහන් ලිපිය මගින් ශ්‍රී ලංකා ජපාන තානාපති ඉසාමු නිට්ටා වෙත දැනුම් දීමක් කර තිබුණි.

**"ලිපි ශීර්ෂය**

**ද සිල්වා සහ පෙරේරා**

<u>ලියාපදිංචි තැපැල</u> 1991 නොවැම්බර් 12

අතිගරු ඉසාමු නිට්ටා
ශ්‍රී ලංකාවේ ජපාන තානාපති
ජපන් තානාපති කාර්යාලය
20, ග්‍රෙගරි පෙදෙස
කොළඹ 7

අතිගරු තානාපති තුමනි,

<u>හිල්ටන් හෝටලය</u>
<u>හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ්</u>
<u>ඩී. සී. කොළඹ නඩු අංක 3155/ විශේෂිත</u>

ඉහත සඳහන් කාරණයෙහි පැමිණිලිකරු වන, අපගේ සේවාදායක නිහාල් අමරසේකර, එෆ්.සී.ඒ., එෆ්.සී.එම්.ඒ. වෙනුවෙන් අප ඔබ වෙත ලිපියක් යොමු කරන අතර, එමගින් පහත කරුණු කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවීමට කැමැත්තෙමු.

අපගේ සේවා දායක විසින් එකී ක්‍රියාව අනෙකුත් කරුණු අතරතුර, ජපානයේ මිට්සුයි සහ සමාගම, ජපානයේ තායිසෙයි සහ සමාගම සහ ජපානයේ, කැන්කෝ කිකාකු සෙක්කෙෂියා යොෂෝ ෂිබාටා සමාගමට එරෙහිව,කොටස්කරුවකු විසින් සිදු කරන ව්‍යුත්පන්න ක්‍රියාවක් ලෙස ස්ථාපිත කරන ලදී.

ඉහත ක්‍රියාවට අදාළව එකීජපාන සමාගම් විසින් ඒ සම්බන්ධයෙන් ගොනු කරනු ලැබූ විරෝධතාවන් පරීක්ෂා කිරීමෙන් අනතුරුව,91.10.28 දිනැතිව උගත් දිස්ත්‍රික් විනිසුරු විසින් ලබා දුන් නියෝගයේ පිටපත් සහ ඒ අනුව එකී ජපාන සමාගම් වලට එරෙහිව ඒ සම්බන්ධයෙන් ලබා දුන් අතුරු තහනම් නියෝගයන්හි පිටපත් මේ සමඟ අමුණා එවමි.

තෙවන ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාව නිරන්තරයෙන් ජපානයේ කීර්ති නාමයෙහි සමෘද්ධිය පිළිබඳව විහරණය කරනු ලබන බව ඔබතුමා දැනුවත්ය. ඒ අනුව, ඔබතුමා, අප රටෙහි ජාතික ආර්ථික වැදගත්කමට අදාළ මෙම බරපතල කාරණයන් සම්බන්ධයෙන් සංඥේයත්වයට ගනු ඇතැයි සහ සුදුසු ක්‍රියාමාර්ග ගනු ඇති බවට සහ ජපානයේ අදාළ අධිකාරීන් වෙත අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා එකී කාරණයන් යොමු කරනු ඇතැයි අප විශ්වාස කරන්නෙමු.

අතිගරු තානාපතිතුමනි, අප රටවල් දෙක අතරතුර පවතින මනා සම්බන්ධතාවයෙහි යහපත සඳහා, එකී සමාගම්වල එවැනි ක්‍රියාවන් සහ හැසිරීම සුදුසු නොවන බව ඔබ සැකයකින් තොරව නිවැරදි ලෙස වටහා ගනු ඇත.

එකී ක්‍රියාවන් මගින්, මෙම කාරණයට අදාළව තිබෙන කැපී පෙනෙන සාධක උපදවා දෙන,අපගේ සේවාදායක වෙනුවෙන් ඔහුගේ උගත් නීතිඥ විසින් ගොනු ගත කරනු ලැබූ පැමිණිල්ලෙහි සහ ඒ සමඟ සිදු කළ ලිඛිත ඉදිරිපත් කිරීම්වල පිටපතක්ද මේ සමඟ අඩංගු කර ඇත.

ඔබගේ හිතවත්
*(අත්සන)*
*නීතිඥ*

පිටපත්: ගරු. හැරල්ඩ් හේරත්, විදේශ කටයුතු අමාත්‍ය, විදේශ කටයුතු අමාත්‍යාංශය, ශ්‍රී ලංකාව
ලේකම්, විදේශ කටයුතු අමාත්‍යාංශය, ශ්‍රී ලංකාව
ජපානයේ ශ්‍රී ලංකා තානාපති"

ඒ කෙසේ වෙතත්, පුදුමාකාර ලෙස, ජනාධිපති ආර්. ප්‍රේමදාසගේ ඉහත කී ස්ථාවරයට පටහැනිව, අනුප්‍රාප්තිය ගරු නීතිපති ජනාධිපති නීතිඥ ටි.ජේ. මාරපන විසින් ජනාධිපති නීතිඥ ෂිබ්ලි අසිස් හරහා කොළඹ දිසා අධිකරණයේදී පරීක්ෂණයන් සඳහා සහභාගි වීමකින් තොරව, අතුරු තහනම් නියෝග නිකුත් කිරීම මත, කිසිම ලේඛනයක් පවා අභියාචනාධිකරණයේ ගොනු නොකර, කොළඹ දිසා අධිකරණයේ තීන්දුවට එරෙහිව, මෙම ජපන් සමාගම් විසින් සිදු කළ අභියාචනයන්ට අභියාචනාධිකරණයේදී සහාය දක්වන්නට ඉදිරිපත් විය.

මිට අමතරව HDL සමාගමේ වැරදි කළ විත්තිකාර-අධ්‍යක්ෂකවරයෙකු ලෙස නම්කර තිබු පාර්ලිමේන්තු මන්ත්‍රී ජනාධිපති නීතිඥ කේ. එන්. චොක්සි විසින් අභියාචනාධිකරණය නොමග යැවීම සඳහා, නිහාල් ප්‍රනාන්දු නීතිඥවරයා හරහා පෙනී සිටින ලදී. කෙසේ වෙතත් පසුව ඉහල අධිකරණය වන ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මෙම පාර්ශ්වකරුවන් දෙදෙනාම ශ්‍රේෂ්ඨාධිකරණයේ කටයුතු සඳහා සහභාගී වීම වැළැක්වීමට කටයුතු කරන ලදී.

ඉන් අනතුරුව 1991.11.28 දින මුදල් අමාත්‍යාංශ ලේකම් ආර්. පාස්කරලිංගම් විසින් ජනාධිපති ලේකම් කේ.එච්.ජේ. විජයදාස අමතා පහත දැක්වෙන ලිපියෙහි පරිදි, වෙනත් කරුණු අතරතුර ප්‍රකාශ කරන ලද්දේ, මුදල් අමාත්‍යාංශය විසින් විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ජේ. එෆ්. ඒ. සෝසාට කොළඹ හිල්ටන් හෝටලය ඉදිකිරීමේදී අක්‍රමිකතා සිදුවී ඇති බවට පරික්ෂා කොට මෙම දැවැන්ත වංචාව පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටි බවයි. නමුත් ජේ. එෆ්. ඒ. සෝසා විසින් සියළු ලිපි ලේඛන පරික්ෂා කල බව පවසමින්, කොළඹ හිල්ටන් හෝටලය ඉදිකිරීමේදී කිසිදු අක්‍රමිකතාවක් සිදුවී නොමැති බවට සඳහන් කර, ස්වභාවික යුක්තිය අමු අමුවේ උල්ලංඝනය කරමින්, පුදුමාකාර ලෙස පැමිණිලිකාර කර්තෘ ගෙන් කරුණු කරණා විමසීමට අවස්ථාවක් ලබා නොදී කටයුතු කර, ඔහු විසින් ලබා දුන් ඔහුගේ එම ඛේදජනක වාර්තාව, හිතා මතාම මෙම වංචාව වසං කිරීමට ගත් උත්සාහයක් බව පෙනී යයි.

**"ලිපි ශීර්ෂය**
**මුදල් අමාත්‍යාංශය**

1991 නොවැම්බර් 28

කේ. එච්. ජේ. විජයදාස
ජනාධිපති ලේකම්

හිල්ටන් හෝටල ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී වාසුදේව නානායක්කාර විසින් 91.9.5 දින සහ 91.11.18 දිනැතිව අතිගරු ජනාධිපතිතුමා වෙත ලද ලිපි හා සබැඳේ.

මෙම විෂය කරුණ, හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ් හි හිටපු අධ්‍යක්ෂක නිහාල් ශ්‍රී අමරසේකර මහතා විසින් අධිකරණයේ ගොනු කරනු ලැබූ නඩු දෙකක් සඳහා පොරොත්තු තීරණයකි.

මෙම කාරණය මතුයෙහි අධිකරණය විසින් විනිශ්චය කිරීම සඳහා වූ හිමිකම නිවැරදි නොවේ. මෙම නඩු දෙකෙන් එකක (ඩී.සී. කොළඹ 3155/ විශේෂිත) නඩු විභාග කටයුතු පොරොත්තු වෙමින් අතුරු තහනම් නියෝගයන්ට එළඹ ඇත. නිහාල් අමරසේකර මහතා විසින් අධිකරණයෙහි සිදු කල සම්ප්‍රකාශයන් සම්බන්ධයෙන් මා විසින් උපදෙස් ලබා දෙනුයේ, දිස්ත්‍රික් අධිකරණය පහත පරිදි නිරීක්ෂණය කර ඇති බවයි. – "සත්‍ය වශයෙන්ම, අදාළ කාරණා සම්බන්ධව පවතින සාක්ෂි මත, එකී කාරණය සම්පූර්ණ නඩු විභාගයක් ලෙස පැවතිය හැකි බවට සැළකිය හැකි වේ. "

එකී කාර්යයෙහි 2 වන සහ 3 වන විත්තිකරුවන් වන හිල්ටන් හෝටල් ව්‍යාපෘතියෙහි ජපන් සහකාරක විසින්, එකී නියෝගයට එරෙහිව අභියාචනාධිකරණයෙහි අයැදුම් අංක 206/91 මගින් අභියාචනය කරනු ලැබ ඇත.

මෙකී තත්වයන් තුළ, රජය විසින් ගැනීම අවශ්‍ය වන කුමන කාර්යයක් හෝ පවතී නම්, එසේ සිදු කිරීමට පෙර, ඒ සඳහා කරුණු විනිශ්චයට භාජනය කර සහ අවසන් අධිකරණය තීරණය ලැබෙන තෙක් රැඳ සිටීම අත්‍යාවශ්‍ය වේ.

මුදල් අමාත්‍යාංශයේ විවාරණය සම්බන්ධයෙන් : හිල්ටන් හෝටල් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී කියන ලද පරිදි වූ ඇතැම් අක්‍රමිකතාවයන් පිළිබඳව අමරසේකර මහතා විසින් පළමුව අමාත්‍යාංශයේ අවධානයට ගෙන ආ අවස්ථාවේදී, අමාත්‍යාංශය විසින් එකී කරුණ සම්බන්ධයෙන් පරීක්ෂණය කර වාර්තා කරන ලෙසට විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ජේ. එෆ්. ඒ. සෝසා මහතාගෙන් ඉල්ලා සිටින ලද බව සිහි කිරීමට කැමැත්තෙමි. සෝසා මහතා විසින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධිත සියලුම ලේඛනයන් පරීක්ෂා කිරීමෙන් අනතුරුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී කිසිදු අක්‍රමිකතාවයක් සිදුව නොමැති බවට වාර්තා කරනු ලැබ ඇත. පසුව, අතිරේකා සොල්ස්ටර් ජනරාලි විසින් අමාත්‍යාංශය වෙන දනුවනු ලැබුවේ, මෙම කරුණ පරීක්ෂා කරන ලද බැවින්, නීතිපති දෙපාර්තමේන්තුවට අමරසේකර මහතාගේ විවාදය සමඟ එකඟ වීමේ හැකියාවක් නොමැති බවයි.

*(අත්සන)*
ආර්. පාස්කරලිංගම්
ලේකම්
මුදල් අමාත්‍යාංශය"

උපහාසාත්මක ලෙස, 1991.12.17 දිනැති ලිපිය පරිදි අතුරු තනහම් නියෝග නිකුත් කිරීමෙන් පසු සහ 1991.10.28 දින දිසා අධිකරණයේ නියෝග නිකුත් කිරීමෙන් පසු, පාර්ලිමේන්තු මන්ත්‍රී ජනාධිපති නීතිඥ කේ. එන්. චොක්සි නම් නොකරමින්, කොළඹ දිසා අධිකරණය තරයේ හෙළා දැක ප්‍රකාශ කර තිබුණේ, සමාජයේ බලය ක්‍රියාත්මක කරන බලවතුන් මැදිහත් වී

කොළඹ හිල්ටන් හෝටලය ඉදිකිරීමේදී, ගෙවීම් කිරීමට පූර්වයෙන් ඉදිකිරීම් සඳහා කරන ලද සැපයුම් නිවැරදිව විභාග කිරීම සහ එම ඉදිකිරීම නිසි ලෙස පරික්ෂා කිරීම වළක්වාලමින්, ඔවුන්ට ගෙවීම් කිරීමට පියවර ගෙන තිබූ බවයි. කෙසේ වෙතත් 1991.12.17 දිනැති මෙම ලිපියේ පුදුමාකාර ලෙස භාණ්ඩාගාර ලේකම් ආර්. පාස්කරලිංගම් විසින් මෙලෙස සටහනක් තබා ඇත - "*කරුණාකර නීතිපති හා චොක්සි මහතා ගෙන් උපදෙස් ලබා ගන්න. අතිගරුට (ජනාධිපතිහට) මෙම ලිපියට පිළිතුරු දීමට අවශ්‍යය*".

**"ලිපි ශීර්ෂය**
**පාර්ලිමේන්තුව**

<u>*ලියාපදිංචි තැපැල*</u>
පිටපතක් අතින් යොමු කර ඇත. 1991 දෙසැම්බර් 17 දින

අතිගරු ආර්. ප්‍රේමදාස
ශ්‍රී ලංකා ජනාධිපති
ජනාධිපති ලේකම් කාර්යාලය
කොළඹ 1

අතිගරු ජනාධිපතිතුමනි,

<u>හිල්ටන් හෝටලය</u>

මුදල් අමාත්‍යාංශයේ ලේකම් ආර්. පාස්කරලිංගම්ගේ 91.11.28 දිනැති ලිපිය යොමු කරමින් එවන ලද අතිගරු ජනාධිපතිතුමාගේ 91.12.03 දිනැති ලිපිය ලද බව දන්වමි.

අතිගරු ජනාධපති වෙත ආමන්ත්‍රණය කරනු ලැබූ මාගේ ලිපි කිහිපයෙන් ප්‍රේරණය කරනු ලැබූ කරුණු, පාස්කරලිංගම් මහතාගෙන් ලද පිළිතුරු වලින් ඉටු වී නොමැත.

පෙර ලබා දුන් වාරණ නියෝගයන් අනුගමනය කරමින්, අතුරු තහනම් නියෝගයන් නිකුත් කරනු ලැබූ උගත් කොළඹ දිස්ත්‍රික් විනිසුරුගේ සොයා ගැනීම් අනුව, අවිවාදා හෙළි කිරීම් වන්නේ, ජපන් සමාගම් විසින් රජයේ සහ මහජනතාවගේ යහපතට එරෙහිව මහත් වූ වංචාවක් අයහපත් ලෙස සිදු කර ඇති බව සහ හිල්ටන් හෝටලයේ අයිතිකාර සමාගමෙහි සමහර දේශීය අධ්‍යක්ෂකවරුන් වංචනිකව ඔවුන් සමඟ වංචා කිරීමට සැලසුම් කර ඇති බවයි.

උගත් කොළඹ දිස්ත්‍රික් විනිසුරුගේ එම සොයා ගැනීම් අනුව, ඉඩම සම්බන්ධ ප්‍රධාන විධායක ලෙස අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රඹුඛතම ඉතා හදිසි තීරණයන් සඳහා, පහත කරුණු මතු කෙරේ.

(අ) සත්‍ය ලෙසම රුපියල් බිලියන ගණනක් රටකින් වංචාවෙන් පැහැර ගැනීමට හැකි එවැනි ක්‍රම තිබේද සහ ඒ සඳහා වග කිව යුතු කවුරුන්ද?

(ආ) හිල්ටන් හෝටල් ව්‍යාපෘතිය සඳහා සම්බන්ධ වූ ජපාන සමාගම් මේ සඳහා වගකිව යුතුද සහ දේශීය අධ්‍යක්ෂකවරුන් අතර සිටි වංචනිකව සහ ද්‍රෝහී රැවටලිකාර ලෙස වංචාව සැලසුම් කල අධ්‍යක්ෂකවරන් කවුරන්ද?

(ඇ) සමාගම තුල ඔවන් දැරූ තනතුර හෝ රජය තුල ඔවුන් දැරූ වෙනත් තනතුරු ක්ෂණිකව ගලවා දැමීමට දේශිය පුද්ගලයින් වග කිව යුතුද?

(ඇ) උගත් දිස්ත්‍රික් විනිසුරු විසින් සිදු කල මෙම සොයා ගැනීම් ජපාන රජයේ සහ ජපන් ජනතාවගේ අවධානයට ගෙන හැර දැක්විය යුතුද සහ ඒ මත ජපන් රජය විසින් සුදුසු ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට ඉල්ලා සිටිය යුතුද?

(ඉ) මෙම වංචාව සඳහා සම්බන්ධ වූ දේශීය පුද්ගලයින් නීති ක්‍රියාමාර්ග ගැනීම සඳහා අධිකරණය ඉදිරියට පැමිණිය යුතු නොවේද?

තවදුරටත් කිසිදු කල් ඉකුත් වීමකින් තොරව, ඉහත කරුණු විමර්ශනය කල හැකි සහ කල යුතු වන අතර, එවැනි විමර්ශනයන් මෙරටෙහි හෝ ජාත්‍යන්තරයෙහි දන්නා කිසිදු නීතියකට විරුද්ධ ලෙස පටහැනිව පෙන්නුම් නොකල යුතුය. නොඑසේ නම්, වැරදි සහගත පුද්ගලයින් විසින්, මේ වන විට විමර්ශනය කෙරෙන ඔවුන් විසින් සිදු කරනු ලැබූ අපරාධයන්ට එරෙහිවආරක්ෂා වීමේ ආවරණය තුල ඕනෑම සිවිල් ක්‍රියාමාර්ගයන් ගත හැකි වනු ඇත. විනිශ්චයට භාජනය වී ඇති කරුණු වෙනත් විනිශ්චයක සාකච්ඡාවට හෝ සළකා බැලීමට ගනු නොලබන අතර සමාන්තරව තවදුරටත් සම්බන්ධිත ගැටලුවල වටිනාකම සළකා බලනු ඇත. නමුත් කිව යුතු වන පරිදි, ඕනෑම ගැටලුවක් විනිශ්චයට භාජනය කරන සහ එබැවින් අපරාධය සම්බන්ධිත විමර්ශනයන් පෙනී සිටීමට බාධා විය හැකි අතර, ඕනෑම සිවිල් සමාජයකට පිළිගත නොහැකි හාස්‍ය උපදවන නීතියකි. විනිශ්චයට භාජනය කිරීම යනු අනෙකුත් උපක්‍රමයන් මගින් නීතිය පෙරලීමට හැකි මායාකාර සූත්‍රයක් නොවේ.

ආර්. පාස්කරලිංගම් මහතාගේ ලිපියේ අවසාන ඡේදයෙන්, අමරසේකර මහතා විසින් මෙම කරුණු මතු කල අවස්ථාවේදී, අනන්‍ය ගැටලු මත උගත් දිස්ත්‍රික් විනිසුරු විසින් ලබා දුන් නියෝග මතුයෙහි, මුදල් අමාත්‍යාංශය විසින් ගනු ලැබූ බවට සඳහන් කරනු ලබන ක්‍රියාමාර්ගයන් විසිරී යන අතර, එබැවින් මේ වනවිට තවදුරටත් අදාළ නොවන හෝ වලංගු නොවන ලෙස පවතී.

පාස්කරලිංගම් මහතා විසින් ඔහුගේ ලිපියෙහි ඡේද අංක 3 හි, උගත් දිස්ත්‍රික් විනිසුරුගේ නියෝගයෙන් එක් වගන්තියක් උපුටා දක්වමින්, උගත් දිස්ත්‍රික් විනිසුරු විසින් සිදු කල සමස්ථ නියෝගයම එකට ගනිමින්, වංචාව පිළිබඳ ඔහුගේම නිගමනය සම්බන්ධයෙන් අවධානය කිසිදු අයුරක පුළුල් කිරීමකට වඩා වැඩිදුර පරීක්ෂණය එහි වටිනාකම සහතික ලෙස කියා සිටින ලදී.

උගත් දිස්ත්‍රික් විනිසුරුගේ නියෝගයට එරෙහිව ජපන් සහයෝගීතාවයන් අභියාචනය කල හේතුව සහ ජාතික යහපත පිණිස වන නඩු කටයුතු වලට මැදිහත් වීමට නීතිපති දෙපාර්තමේන්තුව අපොහොසත් වීම සහ මෙම වංචාවටබාධා කිරීම අවශ්‍ය නොවන ලෙස මෙම තත්වය තුල අතිගරු ජනාධිපති විසින් පමණක් අවංක විවෘත කටයුතු කිරීමකෙසේද යත්, අපරාධ හෝ සැක කිරීම් වලට එරෙහිව ක්‍රියා කිරීම ආරම්භ කර ඇත.

ඔබගේ හිතවත්

*(අත්සන)*
වාසුදේව නානායක්කාර, පා. ම.

පිටපත් : 1. ගරු. ඒ. සී. එස්. හමීඩ්, පා.ම.,
අධිකරණ අමාත්‍ය,
උපරිමාධිකරණ සංකීර්ණය,
කොළඹ 12.

2. ගරු. නීතිපති,
නීතිපති දෙපාර්තමේන්තුව
කොළඹ 12.

3. ආර්. පාස්කරලිංගම් මහතා,
ලේකම්, මුදල් අමාත්‍යාංශය,
මහ ලේකම් කාර්යාලය,
කොළඹ 1."

කර්තෘගේ පළමු නඩුවේදී මහා පරිමාණ බරපතල වංචාවක් සිදුවී ඇති බව බැලූ බැල්මට තහවුරුවේ යැයි සහ කර්තෘට එය සාර්ථකව ඔප්පුකර ගැනීමට හැකිවේ යැයි ප්‍රකාශ කරමින්, ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 1992.12.2 දින ඓතිහාසික විනිශ්වයක් ලබා දී, විදේශ විනිමය විශාල ප්‍රමාණයක් මෙරටින් කූට ලෙස බැහැර කිරීම වලක්වා ලමින්, අතුරු තහනම් නියෝග නිකුත් කර ඇති අතර, එසේ තිබියදීත්, ඉන්පසුව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් 1992.12.7 දිනැති ලිපියේ සඳහන් කරනු ලැබ ඇත්තේ JETRO නියෝජිත පිරිස ඔවුන්ගේ කනස්සල්ල ප්‍රකාශ කරමින් කොළඹ හිල්ටන් හෝටලයේ 'ගැටලුවට' විසඳුමක් ඔවුන්හට අවශ්‍ය බවයි.

**"ලිපි ශීර්ෂය**
**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය**

1992දෙසැම්බර් 07

කේ. ෂන්මුගලිංගම් මහතා
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්
මහා භාණ්ඩාගාරය
මහ ලේකම් කාර්යාලය
කොළඹ 1

හිතවත් මහතාණනි,

එක්ස්පෝ 92 සම්බන්ධයෙන් වන ජෙට්රෝ (JETRO)හි දූත මණ්ඩලයක් නොබෝදා ශ්‍රී ලංකාව වෙත පැමිණ සිටියහ. මෙම නියෝජිත පිරිස හමුවීමේ අවස්ථාව මා වෙත උදා වූ අතර, පසුව, මෙම නියෝජිත පිරිසෙහි සාමාජිකයන් සඳහා ජෙට්රෝ (JETRO)විසින් සංවිධානය කරන ලැබූ විශේෂිත උත්සවයකට සහභාගී වීමි.

මෙම දිවා භෝජන සංග්‍රහ රැස්වීමේදී, අපගේ අදහස් හුවමාරු කර ගත් අතර එහිදී මෙම නියෝජිත පිරිසෙහි නායකත්වය දැරූ එම්. සවාකි මහතා විසින් අප වෙත දන්වන ලද්දේ, හිල්ටන් හෝටල් ගැටලුව පිළිගත හැකි විසඳුමක් වෙත ළඟා වන තුරු, ශ්‍රී ලංකාව තුළ ප්‍රධාන ජපන් ආයෝජන සිදු කිරීම අසම්භව්‍ය බවයි.

මෙය ජපාන රජයේ බලධාරීත්වය සමඟ සමීප සම්බන්ධතාවයක් පවතින ජොෂ්ඨ උපදේශකගේ සැලකිය යුතු මතයක් වන බැවින්, මෙම කරුණ සම්බන්ධව ඔබ වෙත දැන්වීමට අප අදහස් කළෙමු.

ඔබගේ හිතවත්

*(අත්සන)*
එම්. පි. ටි. කුරේ
විධායක අධ්‍යක්ෂ (ආයෝජන)
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය"

කෙසේ වෙතත්, එහි ප්‍රතිඵලයක් ලෙස කර්තෘගේ පළමු නඩුව සඳහා සාර්ථකව කොළඹ දිසා අධිකරණය විසින් නිකුත් කර තිබූ අතුරු තහනම් නියෝග ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ තහවුරු වීමත්, බැලූ බැල්මට පෙනෙන මහා පරිමාණ දැවැන්ත වංචාවක් ලෙස ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අනුමත කිරීමෙන් පසු, කර්තෘගේ සමීප මිතුරෙකු වූ පාර්ලිමේන්තු මන්ත්‍රී, නීතිඥ වාසුදේව නානායක්කාර විසින් ජනාධිපති ආර්. ප්‍රේමදාස වෙත ලිපියක් යොමු කරමින්, රජය මේ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද යන්න පිළිබඳව ලිඛිතව ඔහුගෙන් ප්‍රශ්න කර ඇත.

කොළඹ දිසා අධිකරණය විසින් වාරණ නියෝග නිකුත් කර තිබූ අවස්ථාවේදී, ජනාධිපති ලේකම් කේ. එච්.ජේ. විජයදාස විසින් ඔහුගේ 1990.12.17 ලිපියේ සඳහන් කර තිබූ ශ්‍රී ලංකා රජයේ ස්ථාවරය සම්පූර්ණයෙන්ම උඩු යටිකුරු කරමින්, පහත සඳහන් 1993.2.5 දිනැති ඔහුගේ ලිපියෙන් පුදුමාකාර ලෙස ගත් එම ස්ථාවරයෙන් මෙසේ සිදු වන්නේ, එම නඩුවට ප්‍රබල සහ බලගතු දේශපාලඥයෙක් පැටලී සිටි නිසාද සහ මෙම නඩුව ගැන උනන්දු වන පාර්ශවකරුවන්ගේ බලපෑම් මත නිසාද යන්න පිළිබඳ තවදුරටත් ප්‍රශ්නයක් පැන නගී. තවදුරටත් ප්‍රශ්නයක් මතුවන්නේ, ජනාධිපති ආර්. ප්‍රේමදාස නොමග යවා තිබීම හෝ මේ සම්බන්ධයෙන් නිවැරදිව දැනුවත් නොකළේද යන්නය.

**"ලිපි ශීර්ෂය**
**ජනාධිපති ලේකම් කාර්යාලය**

1993 පෙබරවාරි 5

හිතවත් මහතාණනි,

<u>හිල්ටන් හෝටලය</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ 1993 ජනවාරි 27 දිනැති ලිපිය ලද බව ඔබ වෙත දැන්වීමට අතිගරු ජනාධිපතිගේ උපදෙස් ලදිමි. මෙම නඩුවට අදාළ සාධක සොයා දැනගන්නා ලෙස සහ ඒ පිළිබඳව ඔබට සම්පූර්ණයෙන් විස්තර කරන ලෙසට අතිගරු ජනාධිපති මා වෙත උපදෙස් ලබා දුනි.

මෙම විෂය කරුණ සම්බන්ධයෙන් වන ඔබ විසින් යොමු කළ පූර්ව ලිපි සඳහා අතිගරු ජනාධිපති විසින් ප්‍රතිචාර දක්වා නොමැති බව ඔබ විසින් ප්‍රකාශ කර ඇත. මෙම විෂය කරුණ සම්බන්ධයෙන්, මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් මා වෙත යොමු කරනු ලැබූ ලිපි සමඟින්, අතිගරු ජනාධිපති විසින් 1991 අගෝස්තු 20 දිනැතාව සහ 1991 දෙසැම්බර් 3 දිනැතිව පිළිතුරු යොමු කරනු ලැබ ඇති බව ඔබගේ කාරුණික අවධානයට ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි. ඔබගේ 1991 දෙසැම්බර් 17 දිනැති ලිපිය, ප්‍රධාන වශයෙන්, ඉහතින් සඳහන් කල පරිදි පිළිතුරු යොමු කරනු ලැබූ ඔබගේ පූර්ව ලිපිවල පුනරුච්චාරණයක් බව සඳහන් කරමි.

ඔබගේ පිළිතුරු අපේක්ෂිත ලිපියෙහි, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයට සහාය දැක්විම පිණිස ඔබ විසින් සිදු කරන ලැබූ සම්ප්‍රකාශයන් පිළිබඳ කිසිදු විශේෂිත ප්‍රකාශයක් ඔබ විසින් යොමු කරන ලැබ නොමැත.

එබැවින්, අතිගරු ජනාධිපති හට අදාළ විනිශ්චය සම්පූර්ණයෙන් පරීක්ෂා කිරීමට එය හේතු විය. මෙම කරුණ සම්බන්ධයෙන්, අතිගරු ජනාධිපති විසින් පහත පරිදි උපදෙස් ලබා දෙන ලදී.

(අ) පා.ම., ජනාධිපති නීතිඥ කේ. එන්. චොක්සි මහතා පිළිබඳව; විනිශ්චය තුල සොයා ගැනීමක් හෝ නිගමනයක් හෝ කිසිදු නිරීක්ෂණයක් මොනම අයුරකින්වත් ඇතුලත්ව නොමැත. සත්‍ය වශයෙන්ම, විනිශ්චයෙහි කිසිදු ස්ථානයක ඔහුව ඔහුගේ නමින් හෝ විස්තරයකින් සඳහන් කිරීමක් කර නොමැත. ඔහුව විනිශ්චය තුළ කිසිදු ලෙසකින් හඳුනා ගෙන නොමැත.

(ආ) ජපන් කොන්ත්‍රාත්කරුවන් සහ ගෘහ නිර්මාණ ශිල්පීන් පිළිබඳව; අධිකරණය විසින් කිසිදු සොයා ගැනීමක් හෝ නිගමනයක් නොමැත. එයට පටහැනි ලෙස, අධිකරණය විසින් පහත පරිදි නිරීක්ෂණය කර ඇත. :-

" එකී ප්‍රකාශය වාද කල සාධක මත පදනම්ව සහ උපකල්පිත මත විතර්ක කල ප්‍රශ්න නීතියේදී අවිනිශ්චිත බැවින් සහ එම ක්‍රියාව සඳහා අවසන් විනිශ්චය ලැබෙන තෙක් අවිනිශ්චිතව පවතින බැවින්, පැමිණිලිකරු එවැනි ප්‍රකාශයක් ලබා ගැනීමෙන් අදහස් සඵල වන්නේද යන්න. "

(විනිශ්චයෙහි පිටු අංක 7)
" අතුරු තහනම් ස්වභාවයකින් දුරස්ව, සැබැවින්ම, සාක්ෂි මත පදනම්ව නඩු කීමේ අවසානයේදී උගත් දිස්ත්‍රික් විනිසුරු විසින් තීරණය කිරීම මත පදනම් වන කරුණක් වශයෙන්, පැමිණිලිකරුට සත්‍ය වශයෙන්ම ඔහුගේ ව්‍යුත්පන්න අයිතීන් මත එසේ ස්ථිර ප්‍රකාශයක් ලබා ගෙන පවතින තත්වය තුළ ස්ථාපිත කළ හැකිද යන්න "

(විනිශ්චයෙහි පිටු අංක 10)

" මෙම කරුණ සම්බන්ධයෙන් මා විසින් කියන්නට නියමිත කරුණු මා හට හැකි පරිදි වඩාත් පැහැදිලිව ප්‍රකාශ කරන්නේ නම්, නඩු කීමක් මගින් තීරණය කිරීමට නියමිත ඕනෑම නීතිමය හෝ සාධක කරුණක් මත කිසිදු අයුරකින් නඩ කිරීමේදී අර්ථ විග්‍රහයක් සිදු නොකල යුතු බව මාගේ නිගමනය කල අදහස වේ. "

(විනිශ්චයෙහි පිටු අංක 11)

එබැවින්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මෙම වංචාව සහ කුමන්ත්‍රණය යනාදිය සම්බන්ධයෙන් සොයා ගෙන අධිගමනය කරන ලද බවට ඔබගේ ස්ථිර ප්‍රකාශය, විනිශ්චය මගින් දරනු ලබන්නක් නොවන බව, ඔබ වෙත දන්වන ලෙසට අතිගරු ජනාධිපති විසින් මා වෙත උපදෙස් ලබා දෙන ලදී. සත්‍ය වශයෙන්ම, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නීතිය සහ සාධකයන්හි සියලුම විතර්ක කරන ප්‍රශ්න දිස්ත්‍රික් අධිකරණය වෙත නඩු කීමට සහ තීරණය කිරීමට විවෘත කරමින් ලබා දී ඇති අතර, තවදුරටත් විභාග වෙමින් පවතී.

ඔබට මෙම කරුණු සම්බන්ධයෙන් තවදුරටත් පැහැදිලි කර ගැනීමට අවශ්‍ය වන්නේ නම්, මා වෙත ලිවීමට පසුබට නොවන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

ඔබගේ හිතවත්

*(අත්සන)*

(කේ. ජේ. එච්. විජයදාස)
ජනාධිපති ලේකම්

**වාසුදේව නානායක්කාර මහතා, පා.ම.**
රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී
143/3, කිච් මාවත
කොළඹ 2."

පුදුමාකාරව අන්ධ ලෙස මගහැර තිබුණේ ශ්‍රේෂ්ඨාධිකරණය විනිශ්චයේ ඉතා වැදගත් වචන වූ *'රජය සහතික කරන්නා වී තිබියදී රජයට ඒ පිළිබඳව නොසැලකිලිමත් වී සිටීමට බැරි බවය.'* මෙය *නොසැලකිලිමත් වීමක් පමණක් නොව*, වංචාකාරී ලෙස වංක සහයෝගයෙන්, වසං කිරීමට දැඩි ලෙස උත්සාහ ගැනීමේ අවස්ථාවකි.

පුදුමාකාර ලෙස එම අවස්ථාවේදීම තවත් හෙළිදරව්වක් සිදු වන්නේ, ශ්‍රී ලංකා ජපාන තානාපති මසාකි කුනියාසු විසින් 18.2.1993 දින දරණ පහත සදහන් ලිපිය පරිදි, මුදල් අමාත්‍යාංශයේ ලේකම් ආර්. පාස්කරලිංගම් අමතා පැමිණිලිකාර කර්තෘගේ නඩුවලට නිශ්චිත විසඳුමක් අවශ්‍ය බව පවසමින් ප්‍රකාශ කර සිටියේ *'තවදුරටත් එය නිරාකරණය කිරීම ප්‍රමාද වීමෙන් තත්වය නරක අතට පරිවර්තනය වන බවය'*.

"ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ
ජපාන තානාපති කාර්යාලය
20, ග්‍රෙගරි පාර
කොළඹ 7

1993 පෙබරවාරි 18

ආර්. පාස්කරලිංගම් මහතා
ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 1

හිතවත් පාස්කරලිංගම් මහතාණනි,

ඔබ විසින් ඊයේ දින පවත්වනු ලැබූ අති විශිෂ්ඨ දිවා ආහාර භෝජන ආගන්තුක සත්කාරයට මා බෙහෙවින්ම ස්තූති වන්ත වෙමි. අප දෙනෙ විසින් සිදු කරන ලද සාකච්ඡාවන් ඉතා සිත් ගන්නා සුළු, ප්‍රයෝජනවත් සහ ප්‍රතිඵලදායී වේ. කෙසේ වෙතත්, ජපානය සහ ශ්‍රී ලංකාව දෙරට සඳහාම වඩාත් ප්‍රයෝජනයත් විය හැකි එවැනි අනාගත සාකච්ඡාවන්, ඉදිරි වර්ෂ වලදී වඩාත් කලින් පවත්වනු ඇතැයි මා අපේක්ෂා කරන බව සඳහන් කරනු කැමැත්තෙමි.

මා විසින් ඔබ සමඟ සාකච්ඡා කල පොරොත්තු කරුණ සම්බන්ධයෙන්, එබ දිවයිනෙන් පිටව ගිය පසු කිසිදු ධනාත්මක තත්වයක් සිදු නොවනු ඇතැයි මට හැඟෙන බැවින්, ඔබ ජපානය සහ ඇමරිකා එක්සත් ජනපදය වෙත නික්ම යාමට ප්‍රථම, ඒ සඳහා ස්ථිරසාර බේරුම්කරණයක් පවතින්නේදැයි බැලීමට කටයුතු කිරීමට ඔබට හැකි නම් ඒ සම්බන්ධයෙන් බෙහෙවින් කෘතඥ වෙමි. තවද මෙම බේරුම්කරණය සිදු කිරීමට කල් ගත වන තරමටම එහි තත්වය නරක අතට හැරෙනු ඇති බව මා සඳහන් කිරීමට කැමැත්තෙමි.

සැම අවස්ථාවකදීම ඔබගේ අවබෝධයට සහ ලැබෙන සහයෝගයට ස්තූති වන්ත වෙමි.

ඔබගේ විශ්වාසී

*(අත්සන)*
මසාකි කුනිසායු
ජපාන තානාපති"

ඉන්පසුව 1993.6.21 දින මුදල් අමාත්‍යාංශය විසින්, පැමිණිලිකාර කර්තෘ වෙත ඔහුගේ මුල් නිරීක්ෂණයන් හැකි ඉක්මනින් ලබා ගැනීම සඳහා, බේරුම්කරණ ගිවිසුම් වල කෙටුම්පත් යොමුකර ඇත. එනම්:

**"ලිපි ශීර්ෂය**
**මුදල් අමාත්‍යාංශය**

1993 ජුනි 21

නිහාල් ශ්‍රී අමරසේකර මහතා
167/4, ශ්‍රී විපුලසේන මාවත
කොළඹ 10

හිතවත් මහතාණනි,

<u>හිල්ටන් හෝටලය - කෙටුම්පත් ගිවිසුම</u>

1993 ජුනි 17 දිනැති කෙටුම්පත් ගිවිසුම් අංක. 1, 2 සහ 3 හි පිටපත් මේ සමඟ යොමු කරමි.

93/6/11 දිනැති කෙටුම්පතෙහි වෙනස්කම් කිහිපයක් සිදු කර එකී ගිවිසුම්වල ඇතුලත් කර ඇත. එකී ගිවිසුම් යටින් ඉරි ගසා සහ කොළ පැහැයෙන් වර්ණ ගන්වා ඇත.

මෙම සංශෝධිත ගිවිසුම් මත ඔබගේ නිරීක්ෂණයන් ඉතා ඉක්මනින් ලබා ගන්නා ලෙස, භාණ්ඩාගාර ලේකම් විසින් මා වෙත උපදෙස් ලබා දී ඇත.

ඔබගේ හිතවත්

*(අත්සන)*
වී. එම්. වයි. වේසි වෙට්ටි මිය
භෞතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු
මුදල් අමාත්‍යාංශය"

එම බේරුම්කරණය අවසන් කිරීමට පෙර 1993.5.1 දින කොටි ත්‍රස්ත බෝම්බ ප්‍රහාරයකින් ජනාධිපති ආර්. ප්‍රේමදාස අමානුෂික ලෙස ඝාතනය විය.

ඉන් අනතුරුව, ශ්‍රී ලංකාවේ ජපන් තානාපති කාර්යාලය විසින් කරන ලද ප්‍රයත්නයන් හමුවේ, ජනාධිපති ආර්. ප්‍රේමදාසගේ අනුප්‍රප්තිකයා වූ ජනාධිපති ඩී. බී. විජේතුංග විසින් මෙම හිල්ටන් හෝටලයේ කාරණය විසඳීමට ඉදිරිපත් වි ඇත.

මෙම සන්දර්භය යටතේ, ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශයේ අධ්‍යක්ෂක ජනරාල්, ආර්ථික කටයුතු, ජී. විජයසිරි, 'හිල්ටන් හෝටලය' යන මාතෘකාව යටතේ 1994.4.8 දිනැති 'සංක්ෂිප්ත' සටහනක්, අමාත්‍ය මණ්ඩල අනු කාරක සභාවේ ලේකම්, වෙත යොමු කර තිබු අතර, එහි ශ්‍රී ලංකාවේ ජපාන තානාපති කාර්යාලයේ වැඩසටහන් භාරව සිටි අයි. හශිමොටෝ සමග සිදු කළ සාකච්ඡාවේ සාරාංශය සකසා විදේශ කටයුතු අමාත්‍යාංශයේ රාජ්‍ය ලේකම්, ආර්.සී.ඒ. වැන්ඩර්ගට් විසින් 1994.3.24 දින ඉදිරිපත් කර තිබුණු සටහනක් එහි අඩංගු වී තිබුණි. එම සාකච්ඡාවෙහි අන්තර්ගතය පුදුමාකාර ලෙස තැති ගැන්වීමකි. !

**"ලිපි ශීර්ෂය**
**විදේශ කටයුතු අමාත්‍යාංශය**

1994 අප්‍රේල් 8

ලේකම්
ආයෝජන පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කාරක සභාව
ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලය
කොළඹ 1

<u>හිල්ටන් හෝටලය</u>

කොළඹ ජපාන තානාපති කාර්යාලයේ කාර්ය කටයුතු භාර නිලධාරි අයි. හෂිමොටෝ මහතා විසින් නොබෝදා, විදේශ කටයතු අමාත්‍යාංශයේ රාජ්‍ය ලේකම්, ආර්. සී. ඒ. වැන්ඩර්ගර්ට් මහතා අමතන ලදී. ඔවුන්ගේ සාකච්ඡා අතරතුර, කාර්ය කටයත භාර නිලධාරි විසින්, හිල්ටන් හෝටල් ආරවුල පිළිබඳව සඳහන් කරන ලදී.

ජපාන කාර්ය කටයුතු භාර නිලධාරී සමග පැවති සාකච්ඡාව අනුව වැන්ඩර්ගර්ට් මහතා විසින් සකස් කරනු ලැබූ සටහනෙහි සංක්ෂිප්තයක් මේ සමඟ එවමි. මෙම කරුණු ඊළඟ ආයෝජනය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටු රැස්වීමේදී අවධානයට ගනු ලබන්නේ නම් බෙහෙවින් කෘතඥ වෙමි.

*(අත්සන)*
ජී. විජයසිරි
අධ්‍යක්ෂ ජනරාල් / ආර්ථික කටයුතු "

"ලේකම්,

පෙර දින සන්ධ්‍යා කාලයේ ජපාන තානාපති කාර්යාලයේ කාර්ය කටයතු භාර නිලධාරී අයි. හෂිමොටෝ මහතා මා අමතන ලදී.

2. එය ප්‍රධානව ආචාර සම්පන්න ඇමතුමක් වූ අතර, පහත කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී. එම කරුණු රජයේ අදාළ ආයතනයන් විසින් අධ්‍යයනය කර ප්‍රතිචාර දැක්වීම අවශ්‍ය බව මා සිතමි.

I. වාර්ගික අර්බුදය සම්බන්ධව සහ ඒ පිළිබඳව රජයේ අභිමතය සම්බන්ධයෙන් එල්ටීටීඊ සමඟ සාකච්ඡා කිරීම සඳහා, ජපාන රජය විසින් රජයේ නියෝජිතයන් සහ එල්ටීටීඊ නියෝජිතයන් අතර කතාබහට ස්ථානයක් ලෙස ජපානය ලබා දීම සම්බන්ධයෙන් රජයේ ප්‍රතික්‍රියාව කුමක් විය හැකිද යන්න ඔහු තදින් සිතන බව ඔහු කියන ලදී. ඔහු සිතනුයේ, එවැනි සාකච්ඡාවක් මහජනයාගේ දීප්තයෙන් පිටත ස්ථානයක පැවැත්වීම, එවැනි සාකච්ඡාවක් සඳහා උපකාරී වන වටපිටාවක් ලබා දෙනු ඇති බවයි. මෙම කරුණු සම්බන්ධයෙන් මෙහෙයවීම්ජනාධිපති ලේකම් කාර්යාලයෙන් සිදු කරන බැවින්, මෙම යෝජනා ඔවුන් වෙත සිදු කල යුතු බව මා ඔහුට පිළිතුරු ලබා දෙමින් ප්‍රකාශ කලෙමි.

II. හිල්ටන් හෝටල් ආරවුල පිළිබඳව ජපාන රජය සහ ජපාන ආයෝජකයින්ගේ සැලකිල්ල පිළිබඳවද හෂිමොටෝ මහතා විසින් මාගේ අවධානයට යොමු කරන ලදී. විදේශ ආයෝජකයින් ආකර්ශනය කර ගැනීමට පවතින ශ්‍රී ලංකා විදේශ ප්‍රතිපත්තියෙහි වැදගත්කම අනුව, ශ්‍රී ලංකා ජපාන ද්වි පාර්ශ්වික ආර්ථික සම්බන්ධතා මත වන හිල්ටන් හෝටල් ආරවුල වැනි ආරවුල් වල සමස්ථ බලපෑම පිළිබඳව ශ්‍රී ලංකා රජය විසින්, සිය අවධානය යොමු කල යුතු බව ඔහු විසින් ප්‍රකාශ කරන ලද අතර සහ වඩාත් විශේෂිතව, මෙවැනි ගැටලු විසඳීම සඳහා රජය විසින් ප්‍රමාණවත් සහායක් ලබා නොදෙන බවට ජපාන ආයෝජකයින් විසින් සිතිය හැකි අතර, එහි අහිතකර බලපෑම පිළිබඳව අවධානය යොමු කළ යුතු බව ප්‍රකාශ කරන ලදී. මෙහි සමස්ථ අභිමිකරුවා රට වන බැවිනි. මෙවැනි කරුණක් සම්බන්ධයෙන් ඒවා පෞද්ගලික නිර්ණයන්ට හෝ ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලයේ සාකච්ඡාවලට යනාදියට පවා යොමු නොකරමින්, රජය මෙවැනි කරුණු කෙරෙහි වඩාත් මැදිහත් විය යුතු බව ඔහු සිතයි. ඔහුගේ සැළකිලිමත් අවධානයන් මා විසින් සුදුසු අධිකාරීන් වෙත යොමු කිරීමට කටයුතු කරන බව මම ප්‍රකාශ කළෙමි.

එස්එස් / එෆ්ඒ
24.3.94

පිටපත : ඩීජී / පීඒ
ඩීජී / ඊඒ"

සැබවින්ම මහත් පුදුමාකාර ලෙස සිදු වූ කරුණ නම්, ජපාන රජය දෙමළ ඊලාම් විමුක්ති කොටි සංවිධානය (LTTE) සමග සාකච්ඡා කිරීමට ඉදිරිපත් වී, එම සාකච්ඡා මහජන ප්‍රදර්ශනයෙන් සැගවුණු ආකාරයකට සිදු කිරීමට, ඒම සාකච්ඡා සඳහා සුදුසු වාතාවරණයක් පවතින ජපන් රටේදීම පැවැත්වීමට හැකි බව යෝජනා කිරීමය.

වඩාත් පුදුම සහගත කරුණක් වී තිබුණේ, එය එසේ කිරීමට ජපන් රජය ඉතාමත් අවධානාත්මකව ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටිනු ලැබුවේ, මෙම 'හිල්ටන් හෝටලයේ ආරවුල' යන කාරණය ජපන් රජයට හා ජපන් ආයෝජකයින් වෙත බරපතලව බලපාන බැවින් එය නිරවුල් කර දෙන ලෙසය. තවදුරටත් ප්‍රකාශ කර ඇති පරිදි, එසේ නොකළහොත් ශ්‍රී ලංකා-ජපාන ද්විපාර්ශ්වීක ආර්ථික සබඳතා මත අහිතකර බලපෑමක් ඇති කරන බවත් සහ විශේෂයෙන්ම ජපන් ආයෝජන ශ්‍රී ලංකාවට නොපැමිණීමෙන් එයින් ශ්‍රී ලංකාව බලවත් ලෙස අලාභ ලබන තත්වයට පත් වනු ඇති බවත්ය.

1994 අගෝස්තු මස රජයේ වෙනස් වීමත් සමගම, නව ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග විසින් විශේෂ ජනාධිපති කොමිසමක් පත්කරනු ලැබුවේ, කොළඹ හිල්ටන් හෝටලය ඉදිකිරීමේදී සිදුවී ඇති දැවැන්ත වංචාව විමර්ශනය කිරීම ඇයගේ මැතිවරණ වේදිකාවේ ප්‍රධාන මාතෘකාවක් වූ බැවිනි.

විශේෂ ජනාධිපති කොමිසම ඉදිරියේ සාක්ෂි මෙලෙස මෙහෙයවීමත් සමග, තිගැස්මක් ඇති කළ ශ්‍රී ලංකා රජයට සිදුකල මෙම දැවැන්ත මහා පරිමාණ වංචාව හේතුවෙන් රාජ්‍ය තාන්ත්‍රික පීඩනයන් හමුවේ, ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග විසින්ද නියෝග කරන ලද්දේ, ඉහත බේරුම්කරණ ගිවිසුමේ කෙටුම්පත තවදුරටත් වැඩි දියුණු කොට නිගමනය අවසන් කළ යුතු බවය.

තවද ගරු නීතිපති ජනාධිපති නීතිඥ ෂිබ්ලි අසිස් සහ ජනාධිපති නීතිඥ පි.එල්.ඩි. ප්‍රේමරත්න සමග පැවති සාකච්ඡා වලින් අනතුරුව, අවසන් බේරුම්කරණ ගිවිසුම් විශේෂ ජනාධිපති කොමිසමට ඉදිරිපත් කිරීමෙන් පසුව, ඔවුන් එය අධ්‍යයනය කොට සහ එය අත්සන් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දීමෙන් පසුව, භාණ්ඩාගාර ලේකම් ඒ.එස්. ජයවර්ධන විසින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් සහ ජපානයේ මිට්සුයි සහ සමාගම සහ තායිසෙයි සමාගම, HDL සමාගම සහ පැමිණිලිකාර කර්තෘ සමග 1995 ජුනි මස එම ගිවිසුම් අත්සන් කරන ලදී.

පැමිණිලිකාර කර්තෘගේ අවධාරණය මත, මෙම ජපානයේ මිට්සුයි සහ තායිසෙයි සමාගම් විසින් ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටි මුදලෙන් ප්‍රාග්ධන කොටසෙන් 30% කපාහැරිම සහ අවුරුදු 10 ක කාලයක තුල එකතු වී තිබූ පොලියද කපා හැරීම සහ ඉතුරු කපා නොහැරිය ප්‍රාග්ධන කොටස නැවත උපලේඛන ගත කර තවත් වසර 16 කදී 5.25% ක් අඩු පොලියකට කොටස් වශයෙන් ගෙවීමට දිර්ඝ කිරීමට එකගවී තිබුණි. මෙය ශ්‍රී ලංකා රජයේ ඇපකර මත, මෙම ජපන් සමාගම් ඉල්ලා සිටි මුදලෙන් 62% ක කපා හැරීමකි. එය එම අවස්ථාවේදී යෙන් මිලියන 17,586 නොහොත් ඇමරිකන් ඩොලර් මිලියන 207 වූ අතර ශ්‍රී ලංකා මුදලින් රු. මි. 10,200 විය.

සමථ ගිවිසුම් වල දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා රජයට පැමිණිලිකාර කර්තෘ විසින් සිදු කළ ඉහත කී මෙහෙවරින් HDL සමාගමට සහ ශ්‍රී ලංකා රජයට විශාල වාසියක් අත්වූ බව පිළිගෙන ඇත. මෙම කපා හැරීම 2016.6.30 දිනට

මහා බැංකුවේ පොලී අනුපාතය අනුව රු. මි. 89,177.3 වූ අතර, දීර්ඝ කළ ඉතිරි ශේෂය රු. මි. 51,451.8 විය.

ඉහත ගිවිසුම් ක්‍රියාත්මක කිරීම පිළිබඳව නිවේදනය කිරීම සඳහා මාධ්‍ය සමුළුවක් දින දෙකකට පසුව එනම් 1995.6.30 වන දින මුදල් අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී, අධිකරණ සහ ව්‍යවස්ථා කටයුතු හා නියෝජ්‍ය මුදල් අමාත්‍ය ජී.එල්. පීරිස්ගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලද අතර, විදේශ කටයුතු අමාත්‍ය ජනාධිපති නීතිඥ ලක්ෂ්මන් කදිරගාමර්, සංචාරක අමාත්‍ය ධර්මසිරි සේනානායක, ශ්‍රී ලංකාවේ ජපාන තානාපති මසාකි කුනියාසු, මුදල් අමාත්‍යාංශයේ සහ භාණ්ඩාගාරයේ ලේකම්, ඒ.එස්. ජයවර්ධන සහ පැමිණිලිකාර කර්තෘ ද මෙම මාධ්‍ය සමුළුවට සහභාගී වී ඇත.

මෙම මාධ්‍ය සමුළුවේදී, අධිකරණ සහ ව්‍යවස්ථා කටයුතු හා නියෝජ්‍ය මුදල් අමාත්‍ය ජී.එල්. පීරිස් විසින් වැරදි සහගත සහ අනවශ්‍ය ලෙස බේරුම්කරණය සම්බන්ධයෙන් තමාට ප්‍රශංසාව ලබා ගැනීමට මහත් උද්යෝගයකින් මාධ්‍ය වෙත සිදු කළ ප්‍රකාශ මෙලෙස වාර්තා වී තිබුණි.

> *" ජපානය සහ ශ්‍රී ලංකාව අතර වසර ගණනාවක් පුරා භුක්ති විඳ ගෙන පැමිණි සෞඛ්‍ය සම්පන්න සහ ශක්තිමත් සබඳතාව අවලස්සන විය හැකි ව තිබූ නියත උභතෝකෝටිකයක් වූ ආරවුල් සහගත බේරුම්කරණ ගිවිසුම අත්සන් කිරීමට කටයුතු කිරීම හේතුවෙන්, අද දින ජපානය සහ ශ්‍රී ලංකා රජය වෙනුවෙන් සතුට සලකුණු කෙරෙන දිනයකි. එසේම මිට්සුයි සහ තායිසෙයි ජපාන සමාගම් දෙක පිළිබඳවද හොඳ නමක් අප වෙත තබා ඇත. ජපාන තානාපති යසොවු නගුචි සහ ඔහුගේ පූර්වගාමීයා වූ මසාකි කුනියාසු විසින් ලබා දුන් නොමඳ සහයෝගය මෙම බේරුම්කරණය සිදු කිරීමට ඉවහල් විය."*

> *" ජපන් කොන්ත්‍රාත්කරුවන් සමග අත්සන් කළ බේරුම්කරණය, ජාතික සම්පත් කොල්ලකෑම හා මංකොල්ලයේ එරෙහිව සටන් කිරීමේ මහජන පෙරමුණ ආණ්ඩුවේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශය සමඟ අනුකූල වන අතර, රජයේ කැපවීම මත මහා පරිමාණයේ ඉතිරියක් සිදුව ඇත. කෙසේ වෙතත්, මෙම බේරුම්කරණයෙහි වැරදිකරුවන්ට එරෙහිව නීතිමය යාන්ත්‍රණයකින් හෝ විශේෂ ජනාධිපති කොමිෂන් සභාව විසින් වංචාව සහ දූෂණය මත දඬුවම් පැමිණවීමේ ක්‍රියාවක් කිසිසේත් නොමැත."*

ඉතාමත් අශෝභන ලෙස විදේශ කටයුතු අමාත්‍ය ලක්ෂ්මන් කදිරගාමර් විසින්ද මාධ්‍යයන් වෙත කළ ප්‍රකාශය වාර්තා කර තිබුණේ මෙලෙසිනි.

> *" මෙම බේරුම්කරණය අවසන් කිරීම උත්දීපකයක් වන අතර, නොඑසේ නම් අපේ රටවල් දෙක අතර පැවති සුහද සම්බන්ධතාවය එයින් ඉවත් වනු ඇත. මෙය, අප සියලු දෙනා වෙනුවෙන් සැලකිල්ලට ලක්විය යුතු වන සංවෘත පරිච්ඡේදයක සාක්ෂි ලෙස අපට ඉතා සතුට ගෙන දෙන අවස්ථාවකි."*

ඉන් අනතුරුව එවකට ජපාන තනාපති, යසුඕ නුගුචි විසින් 1997.4.27 දින සන්ඩේ ලීඩර් සමග කළ සම්මුඛ සාකච්ඡාවකදී ප්‍රකාශ කර සිටියේ, හිල්ටන් නඩුව ජපන්-ශ්‍රී ලංකා ආර්ථික සම්බන්ධතාවන්ට හිසරදයක් බවත් සහ ජපන්

ජාතිකයින් ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීමෙන් මුහුණපාන කරදර වලට එය උදාහරණයක් බවත්ය.


පුදුමාකාර ලෙස ඉහත කී අමාත්‍යවරුන් සහ රාජ්‍ය තාන්ත්‍රිකයන් ස්වෛරීය රාජ්‍යන්ට සහ එහි ජනතාවට කළ මෙම දැවැන්ත වංචාව අවතක්සේරු කර එය හිසරදයක් නොහොත් පීඩාකාරී තත්වයක් යයි දැක්වීමට උත්සාහ දරන ලදී. නමුත් ශ්‍රී ලංකාවේ දිළිඳු ජනතාවට එම පාඩුවේ වටිනාකම ඉමහත් වන අතර, 1995 ජුනි මාසයේදී එය ඇමරිකානු ඩොලර් මිලියන 207 කි. මෙයින් පිළිබිඹු වන්නේ පොදු ජනතාවගේ සම්පත් භාරකාරත්වය සම්බන්ධයෙන් ක්‍රියා නොකිරීම සහ දිළිඳු ජනතාවගේ අයිතීන් ආරක්ෂා නොකිරීමය.

ඉන්පසුව, 1996 මැයි මස, කර්තෘ විසින්, විශේෂ ජනාධිපති කොමිසම ඉදිරියේ, බිඳලිය නොහැකි සාපරාධි සාක්ෂි සාධාරණ සැකයකින් තොරව තහවුරු කර ඔප්පු කරන ලදී. විශේෂ ජනාධිපති කොමිසම ඉදිරියේ එළිදරව් වුයේ හිල්ටන් හෝටලයේ මුල් ගෘහ නිර්මාණ සැලසුම් වල හරස්කඩ දක්වා තිබු පිටු ඉවත්කර, නව හරස්කඩ පිටු ඇතුලත් කොට, මහල් අතර නව උස් පහත් භාවය පෙන්නුම් කර ඇති බවය. තවද මහල් දෙකක පිටු දෙකක් ඉවත් කොට A-01 සිට A-07 සැලසුම් වල බිම් යට මහල් වල පිටුද හිල්ටන් හෝටලයේ මුල් ගෘහ නිර්මාණ සැලසුම් වලින් ඉවත් කොට, එම ඉතිරි සැලසුමේ පිටුව A-08 දරණ පිටුවෙන් පමණක් පටන් ගැනීමය.


ඒ අනුව, මහල් පිටු වල පෙන්වා තිබු, මහල් අතර උස් පහත් භාවය (Elevations) නව හරස්කඩ පිටු වල එම මහල් වල පෙන්වා තිබු උස් පහත් භාවය අතර ගැලපීමක් නොතිබීමෙන් කිසිම පැකිලීමකින් තොරව එළිදරව් වුයේ මුල් ගෘහ නිර්මාණ සැලසුම් කඩා කප්පල් කර තිබු බවය. ඒ අතර මුල් ගෘහ නිර්මාණ සැලසුම් වල මහල් අතර උස් පහත් භාවය මීටර් 3.0 වූ අතර ඇතුලත් කර තිබු නව හරස්කඩ පිටුවල එය පෙන්නුම් කර තිබුණේ මීටර් 2.9 ලෙස අඩු කරමිනි.

**මුල් සැලැස්මේ උන්නතාංශයන් වංචනික සැලැස්මේ උන්නතාංශයන්**

**A-28**





**A-29**





මෙම කඩාකප්පල්කාරී ක්‍රියා මත 3වන සහ 4 වන මහල් වල උස් පහත් භාවය එකම උන්නතාංශයන් වූ මීටර් 24.5 වීම සහ 19 වන මහල සහ 19 වන මහලට ඉහලින් තිබෙන්නට තිබුණු වහල පෙන්වා තිබුණේ, මහල් අතර උස් පහත් භාවය 19 වන මහල මීටර් 72.7 ලෙසත් සහ වහල මීටර් 72.0/72.5 ලෙසත් වීමෙන් පුදුමාකාර ලෙස එළිදරව් වුයේ, වහල 19 වන මහලට පහතින් පිහිටු වන්නට තිබූ බවයි. මෙය පහත දක්වා ඇති ගෘහ නිර්මාණ සැලසුම් වල කොටස් වලින් මනාසේ විස්තර කර ඇත.


**3වන මහල**





**4වන මහල**




වංචනික 18 වන මහල





වංචනික 19 වන මහලේ මකා දමන ලද උන්නතාංශය





මහලට ගියවිට සමහර උන්නතාංශයන් – මීටර් 72.0 / මීටර්72.5








ඉහතකී සාපරාධිත්වය එළිදරව් වීමත් සමගම විශේෂ ජනාධිපති කොමිසම තැති ගැන්වීමකින් නිරීක්ෂණය කළේ, මෙවැනි තත්වයක් කිසිසේත්ම නිසගයෙන් ආවේණික නොවන බවත්, නාගරික සංවර්ධන අධිකාරිය මෙවැනි ගෘහ නිර්මාණ සැලසුම් අනුමත කිරීමට අවසරදීමද ප්‍රශ්ණකාරී බවත්ය.

තවද එළිදරව් වුයේ හිල්ටන් හෝටල් ව්‍යාපෘතියේ මුලික ගෘහ නිර්මාණ සැලසුම් වල හරස්කඩ පිටුවල මහල් අතර උස් පහත් භාවය එම කඩා කප්පල් කළ මහල් වල පිටු මත සටහන් කර තිබු මහල් අතර උස් පහත් භාවයට නිසි ලෙස ගැලපෙන බවය. මෙයින් ඔප්පු වන්නේ එම මුල් ගෘහ නිර්මාණ සැලසුම් අනිවාර්යයෙන්ම ඉහතකී ලෙස කඩා කප්පල් කර, පහළම මාලය ඉවත් කොට තිබුණු බවය. (පහත ප්‍රස්ථාර බලන්න)




*Perspectives, Cross-sectional & Floor Layout Sheets as per Project Plans for Colombo Hilton Hotel*




බියව කරන ලද ඉහත කී ගෘහ නිර්මාණ සැලසුම් කඩා කප්පල් කිරීමෙන්, මුලික ව්‍යාපෘතිය අනුව ජාත්‍යන්තර හිල්ටන් සමාගම විසින් ගණනය කර තිබු ලාභදායිතාවය ප්‍රක්ෂේපණ සම්පූර්ණයෙන්ම කඩා කප්පල්කාරී වීමෙන්, එයින් අත්වූ අහිතකර බලපෑම් මෙම ග්‍රන්ථයේ උපුටා දක්වා ඇති දත්ත සහ ගෘහ නිර්මාණ සැලසුම් වලින් මනාසේ එළිදරව් වේ.

තවද පැමිණිලිකාර කර්තෘ විසින් කොළඹ දිසා අධිකරණයේ ගොනු කළ නඩුවේ ඇතුලත් කර තිබූ මෙම ගෘහ නිර්මාණ සැලසුම් පිළිබඳ අධ්‍යයනය කොට වරලත් ගෘහ නිර්මාණ ශිල්පී ෂෙල්ටන් විජයරත්න විලියම්ස් සහ ඇසෝසියේට්ස් සමාගම විසින් සකසා තිබූ විමර්ශනාත්මක වාර්තාව මගින්, විශේෂ ජනාධිපති කොමිසමේදී සාපරාධි සාක්ෂි මගින් ඉහත කී සාපරාධි වංචනිකභාවය සත්‍ය ලෙස සනාථ කොට තහවුරු වී තිබේ.

මෙම එළිදරව් වීම් විශේෂ ජනාධිපති කොමිසමේදී ඉදිරිපත් කළ සාක්ෂි අනුව තැතිගන්වමින් ඔවුන් නගා සිටි ප්‍රශ්නය වූයේ, මෙවැනි කඩා කප්පල්කාරී සැලසුම් නාගරික සංවර්ධන අධිකාරිය විසින් කෙසේ අනුමත කරන ලද්දේද යන්න සහ තවද ඔවුනට එසේ කිරීමට කිසිසේත්ම නොහැකිය යන ප්‍රශ්නයද පැන නගිමිනි.

පසුව නාගරික සංවර්ධන අධිකාරිය ඉහත කී මෙම බරපතල වංචාව පිළිගෙන එම කඩා කප්පල්කාරී ගෘහ නිර්මාණ සැලසුම් ප්‍රතික්ෂේප කොට, ඔවුන් විසින් හිල්ටන් හෝටලයේ සැබෑ ඉදිකිරීමට අනුව නිවැරදි ස්ථාන, මිනුම් සහ උන්නතාංශයන් අනුව නව ගෘහ නිර්මාණ සැලසුම් සකස් කරන ලදී.

ඉහත කී විශේෂ ජනාධිපති කොමිසම ඉදිරියේ එළිදරව් වූ සාපරාධි කරුණු කාරණා සහ ඒවා මනාසේ ඔප්පු වීමත් සමගම, එම ජපන් සමාගම් විසින් ඒ සම්බන්ධයෙන් පිළිතුරු දීමට අපොහොසත් වීමෙන් පසු, ගෘහ නිර්මාණ ශිල්පීන් වන ජපානයේ සුප්‍රසිද්ධ කැන්කෝ කිකාකු සෙක්කෙෂියා යොෂෝ ෂිබාටා සමාගම වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ එල්.සී. සෙනවිරත්න, මෙම සිද්ධිය මත, ඔවුන් වෙනුවෙන් තව දුරටත් පෙනී නොසිටින බවට කොමිසම හමුවේ දන්වා සිටින ලදී.

ඉහත කී තත්වය මත, ජපන් රජය විසින් රජයට දැඩි ලෙස බලපෑම් කලේ, 1996 නොවැම්බර් මස පැවැත්වීමට නියමිත ශ්‍රී ලංකා ආධාර රැස්වීමේදී (Aid-Group Meeting) ශ්‍රී ලංකාවට දීමට නියමිත ඩොලර් මිලියන 245 ක් ලබා දෙනු ලබන්නේ, මෙම බේරුම්කරණ ගිවිසුම් ක්‍රියාත්මක වූ පසුව බවත්, එසේ ක්‍රියාත්මක නොකළහොත්, එම මුදල ශ්‍රී ලංකා රජයට ලබා නොදෙන ලෙසත් ප්‍රකාශ කරමිනි.

මෙම සන්දර්භය තුල, ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංගගේ බැගැපත් ඉල්ලීම සහ මැදිහත් විම මත, එවකට භාණ්ඩාගාර ලේකම් බී. සී. පෙරේරා සහ ගරු නීතිපති ජනාධිපති නීතිඥ සරත් එන්. සිල්වා විසින්, මෙම බේරුම්කරණ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සඳහා 1996 ඔක්තෝබර් මස මෙම බේරුම්කරණ ගිවිසුම් වලට පරිශිෂ්ටයක් (*Addendum*) සකස් කරනු ලැබුවේ කර්තෘගේ එකගතාවයද ලබා ගැනීමෙන්, කර්තෘට රජය විසින් පෙර ඉෂ්ට කරන්නට තිබූ 'පූර්ව කොන්දේසි', 'පසු කොන්දේසි' ලෙස පසුව ඉෂ්ට කර දීමට සත්භාවයෙන් පොරොන්දු වෙමින්ය. කියවිය යුතු පරිශිෂ්ටයන්-

> "රජය කිසිදු බාධාවක් නොමැතිව ජපානය සමඟ සුහද සබඳතා පවත්වා ගනිමින් කටයුතු කිරීමට අදහස් කර සහ රජය එම ගිවිසුම් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම ගැන සැලකිලිමත් වී ඇත.
>
> මෙම තත්වය තුල, රජය, අමරසේකරමහතාගේ කැමැත්ත සහ එකඟතාවය මත, දැන් මෙහි විශේෂයෙන් ලබා දී ඇති ගිවිසුම් අංක 3 සහ 4 හි නියම කර ඇති කොන්දේසි සම්පූර්ණ කිරීමක් නොමැතිව, එම ගිවිසුම් අංක 1 සහ 2 ක්‍රියාත්මක කර ගෙන යාම සඳහා එකඟ වී ඇත. රජය විසින්, ගිවිසුම් අංක 3 සහ 4 යටතේ වන අන්තර්ගතයන් ක්‍රියාත්මක කිරීම සඳහා අදාල නීතිමය තත්වයන් යටතේ අවසර ගෙන පරිපාලන කටයුතු සිදු කිරීමට කටයුතු කරනු ඇති බවට පාර්ශවයන් අතර අවබෝධ කර ගෙන ඇත."

ඒ අනුව, එම පරිශිෂ්ටයට (*Addendum*) රජය වෙනුවෙන් භාණ්ඩාගාර ලේකම්, කර්තෘ, ජපානයේ මිට්සුයි සහ තායිසේ සමාගම් විසින් අත්සන් කර තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා රජයෙන් කර්තෘට කළ ආයාචනයන් සහ අයැදීම් මත, 1996 නොවැම්බර් මස පැවැත්වීමට නියමිතව තිබූ ශ්‍රී ලංකා ආධාර රැස්වීමට (Aid-Group Meeting) ප්‍රථම කර්තෘගේ නඩු දෙක ඉල්ලා අස්කර ගන්නා ලද්දේ රජයේ ඉල්ලීම මතය.

පැමිණිලිකාර කර්තෘ, මිට්සුයි සහ සමාගම සහ තායිසෙයි සමාගම විසින් HDL හි ඔවුන්ගේ කොටස් මත ඡන්ද බලය ලබා දීම පිළිබඳ වෙනස් කල නොහැකි නීතිමය බලතල මහා භාණ්ඩාගාර ලේකම් වෙත ලබා දීම අවධාරණය කර, එය එම පරිශිෂ්ටයේ කොටසක් ලෙස *සකස් කරන ලදී.*

ඉහත කී කර්තව්‍යයට රජය වෙනුවෙන් එවකට භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් ආචාර්ය පී. බී. ජයසුන්දර ඍජුවම මැදිහත් වෙමින්, පැමිණිලිකාර කර්තෘගෙන් බැගැපත් ලෙස ඔහුගේ නඩු ඉල්ලා අස්කර ගැනීමට ඉහත සඳහන් පරිදි ආයාචනා කර සිටි අතර, ඉහත සමථකරණය අරමුණු කර 1996.10.25 දින ඔහු මුලසුන හොබවමින් පැවති HDL සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී, එම කාර්ය සටහන් වල මෙසේ වාර්තා කර තිබුණි.

"මෙම මණ්ඩල රැස්වීම පවත්වනු ලබන්නේ, රජයේ න්‍යාය පත්‍රයට අනුව, ජාතික වැදගත්කමක් ඇති ප්‍රශ්නයක් වන ශ්‍රී ලංකාව සහ ජපානය අතර මිත්‍රශීලි බව ඉදිරියට ගෙන යාමට රජය වෙනුවෙන් ක්‍රියා කරන බව යන්න සභාපති, ආචාර්ය පී. බී. ජයසුන්දර මහතා විසින් දැනුම් දී ඇත. අනිකුත් සියළු දෙනා එකඟ විය"

ඉන්පසු, පමිණිලිකාර කර්තෘ විසින් නඩු ඉල්ලා අස්කර ගත් විගස, කර්තෘ විසින් ලබාගෙන තිබුණු අතුරු තහනම් නියෝග වල ප්‍රතිඵලයක් මත, හිල්ටන් හෝටලය අයිති සමාගමක් වූ HDL සමාගමේ එකතුවී තිබු ඩොලර් මිලියන 30 මගින්, ජපන් රජයේ අවශ්‍යතාවය මත 1996 නොවැම්බර් මස පැවැත්වීමට නියමිතව තිබු ශ්‍රී ලංකා ආධාර රැස්වීමට (Aid-Group Meeting) ප්‍රථම වහාම ඩොලර් මිලියන 29 ක ගෙවීමක් ජපන් සමාගම් වෙත කරන ලදී.

**"ලිපි ශීර්ෂය**

**මහා භාණ්ඩාගාරය**

**රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව**

1996 ඔක්තෝබර් 29

ප්‍රධාන කලමනාකරු
විදේශ සංචිත බැංකු ඒකකය
ලංකා බැංකුව (7 වන මහල)
කොළඹ 1

හිතවත් මහතාණනි,

<u>හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ්</u>

ජපානයේ ටෝකියෝහි, ඔතෙමචි 1- චෝම්, 2-1 හි මිට්සුයි සහ සමාගමේ ගිණුම් අංක 0014710 වෙත බැර වන පරිදි ජපානයේ, ටෝකියෝහි, චොකු, නිහොන්බචි හොන්කොචෝ 1- චෝම්, 3-2 හි පිහිටි, ටෝකියෝ මිට්සුබිසි බැංකුවේ ටෝකියෝ ප්‍රධාන කාර්යාලය වෙත ජපන් යෙන් 644,492,640 ක මුදලක විදුලි ලිපි පැවරුමක් (ටෙලිගැෆික් පැවරුමක්) යැවීමට කාරුණික වන්න.

කරුණාකර, මෙම අරමුදල් පැවරුම සඳහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් නමට තැම්පතු ගිණුමහර කරන්න.

ඔබගේ හිතවත්

ඩී. වයි. ලියනගේ

පී. බාලසුබ්‍රමනියම්
රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත: හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ්"

**"ලිපි ශීර්ෂය**

**මහා භාණ්ඩාගාරය**

**රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව**

1996 ඔක්තෝබර් 29

කලමනාකරු, තැම්පතු
හොංකොං සහ ෂැන්ග්හයි බැංකු සමාගම
24, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත
කොළඹ 1

හිතවත් මහතාණනි,

<u>හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ්</u>

ජපානයේ ටෝකියෝහි, චියොදාකු, ඔතෙමචි 1- චෝම්, 2-1 හි මිට්සුයි සහ සමාගමේ ගිණුම් අංක 0014710 වෙත බැර වන පරිදි ජපානයේ, ටෝකියෝහි, චොකු, නිහොන්බචි හොන්කොචෝ1- චෝම්, 3-2 හි පිහිටි, ටෝකියෝ මිට්සුබිසි බැංකුවේ ටෝකියෝ ප්‍රධාන කාර්යාලය වෙත ජපන් යෙන් 1,050,039,418 ක මුදලක විදුලි ලිපි පැවරුමක් (ටෙලිගැෆික් පැවරුමක්) යැවීමට කාරුණික වන්න.

කරුණාකර, මෙම අරමුදල් පැවරුම සඳහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් නමට ස්ථාවර තැම්පතු ගිණුම් අංක 011-223114-232 සහ 001-223114-235 හර කරන්න.

ඔබගේ හිතවත්

ඩී. වයි. ලියනගේ

පී. බාලසුබ්‍රමනියම්
රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත: හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ්"

---

**"ලිපි ශීර්ෂය**

**මහා භාණ්ඩාගාරය**

**රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව**

1996 ඔක්තෝබර් 29

කලමනාකරු, තැම්පතු
හොංකොං සහ ෂැන්ග්හයි බැංකු සමාගම
24, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත
කොළඹ 1

හිතවත් මහතාණනි,

<u>හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ්</u>

ජපානයේ ටෝකියෝහි, චියොදාකු, ඔතෙමචි 1- චෝම්, 2-1 හි මිට්සුයි සහ සමාගමේ ගිණුම් අංක 0014710 වෙත බැර වන පරිදි ජපානයේ, ටෝකියෝහි, චොකු, නිහොන්බචි හොන්කොචෝ 1- චෝම්,

3-2 හි පිහිටි, ටෝකියෝ මිට්සුබිසි බැංකුවේ ටෝකියෝ ප්‍රධාන කාර්යාලය වෙත ජපන් යෙන් 933,572,859 ක මුදලක විදුලි ලිපි පැවරුමක් (ටෙලිගැෆික් පැවරුමක්) යැවීමට කාරුණික වන්න.

කරුණාකර, මෙම අරමුදල් පැවරුම සඳහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් නමට යෙන් ගිණුම් හර කරන්න.

ඔබගේ හිතවත්

ඩී. වයි. ලියනගේ

පී. බාලසුබ්‍රමනියම්
රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත: හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ්
අධ්‍යක්ෂක ජනරාල්, මූල්‍ය ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු"

---

**"ලිපි ශීර්ෂය**

**මහා භාණ්ඩාගාරය**

**රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව**

1996 නොවැම්බර් 14

කලමනාකරු, තැම්පතු
බැංක් ඉන්ඩෙසුස්
අංක 4, ජිනසේන ගොඩනැගිල්ල
හුනුපිටිය පාර
කොළඹ 1

හිතවත් මහතාණනි,

<u>හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ්</u>

ජපානයේ ටෝකියෝහි, චියොදාකු, ඔතෙමචි 1- චෝම්, 2-1 හි මිට්සුයි සහ සමාගමේ ගිණුම් අංක 0014710 වෙත බැර වන පරිදි ජපානයේ, ටෝකියෝහි, චොකු, නිහොන්බචි හොන්කොචෝ 1- චෝම්, 3-2 හි පිහිටි, ටෝකියෝ මිට්සුබිසි බැංකුවේ ටෝකියෝ ප්‍රධාන කාර්යාලය වෙත ජපන් යෙන් 443,550,134 ක මුදලක විදුලි ලිපි පැවරුමක් (ටෙලිගැෆික් පැවරුමක්) යැවීමට කාරුණික වන්න.

කරුණාකර, මෙම අරමුදල් පැවරුම සඳහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් නමට ස්ථාවර තැම්පතු ගිණුම් අංක 12276-100-00-48 හර කරන්න.

ඔබගේ හිතවත්

ඩී. වයි. ලියනගේ

පී. බාලසුබ්‍රමනියම්
රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත: හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ්"

"ලිපි ශීර්ෂය
මහා භාණ්ඩාගාරය
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

1996 නොවැම්බර් 14

කලමනාකරු, තැම්පතු
හොංකොං සහ ෂැන්ග්හයි බැංකු සමාගම
24, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත
කොළඹ 1

හිතවත් මහතාණනි,

හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ්

ජපානයේ ටෝකියෝහි, චියොදාකු, ඔතෙමචි 1- චෝම්, 2-1 හි මිට්සුයි සහ සමාගමේ ගිණුම් අංක 0014710 වෙත බැර වන පරිදි ජපානයේ, ටෝකියෝහි, චොකු, නිහොන්බචි හොන්කොචෝ 1- චෝම්, 3-2 හි පිහිටි, ටෝකියෝ මිට්සුබිසි බැංකුවේ ටෝකියෝ ප්‍රධාන කාර්යාලය වෙත සෘජුවම ජපන් යෙන් 38,396,501 ක මුදලක විදුලි ලිපි පැවරුමක් (ටෙලිගැෆික් පැවරුමක්) යැවීමට කාරුණික වන්න.

කරුණාකර, මෙම අරමුදල් පැවරුම සඳහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් නමට යෙන් ගිණුම් හර කරන්න.

ඔබගේ හිතවත්

ඩී. වයි. ලියනගේ

පී. බාලසුබ්‍රමනියම්
රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත: හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ්
අධ්‍යක්ෂක ජනරාල්, මූල්‍ය ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු"

මිට අමතරව, රජයෙන් නොව, හිල්ටන් හෝටලය අයිති සමාගමක් වූ HDL සමාගම විසින් ඉතිරි කපා නොහැරිය ණය ශේෂයට අවුරුදු 16ක් තුල කොටස් වශයෙන්, 5.25% ක අඩු පොලියකට ගෙවීමට පොරොන්දු පත්‍ර නිකුත් කරන ලදී.

ඉහත සඳහන් පරිශිෂ්ටයට (*Addendum*) 1996.10.21 දින අත්සන් කර තිබූ අතර, පැමිණිලිකාර කර්තෘගේ නඩු දෙක 1996.10.23 දින ඉල්ලා අස්කර ගෙන සහ HDL සමාගමේ මාණ්ඩලික රැස්වීම 1996.10.25 දින පැවති අතර, කර්තෘ විසින් ලබාගත් අතුරු තහනම් නියෝග මත, HDL සමාගමේ එකතුවී තිබූ ඩොලර් මිලියන 30 න්, 1996.10.28 දින, මිට්සුයි සහ සමාගම සහ තායිසෙයි සමාගම වෙත පැමිණිලිකාර ගෙවීම් සිදු කරන ලදී. මෙයින්

පැමිණිලිකාර කර්තෘ විසින් රජයේ ඉල්ලීම් සහ බලපෑම් වලට සහයෝගයෙන් කඩිසරව ක්‍රියා කිරීම ආදර්ශනය කරනු ලැබේ.

එවකට HDL සමාගමේ එක් රැස්ව තිබූ එක්සත් ජනපද ඩොලර් මිලියන 30 ත්, රජයේ බලපෑම් මත පැමිණිලිකාර කර්තෘ විසින් ඔහුගේ නඩු දෙක ඉවත් කර ගෙන නොතිබුනේ නම්, ශ්‍රේෂ්ඨාධිකරණය තහවුරු කර තිබූ පරිදි ඔහුට ඉතා පහසුවෙන්ම එම නඩු ඉදිරියට ගෙන ගොස් සාර්ථකව ඔප්පු කර ජය ගෙන, පසුව ව්‍යාපාරානුකූලව මිට්සුයි සහ සමාගම සහ තායිසෙයි සමාගම වෙත ගෙවීම් පියවීම සිදු කල හැකිව තිබූ සහ ඒ අනුව රජයේ ඇපකර අවලංගු වීම සිදු විය හැකිව තිබුණි.

රජය විසින් කළ බලපෑම් පරිදි පැමිණිලිකාර කර්තෘ ක්‍රියා නොකළේ නම්, වර්තමානය වන විට මිට්සුයි සහ සමාගම සහ තායිසෙයි සමාගම වෙත දී තිබූ රජයේ ඇපකරද අවලංගු වී, HDL සමාගම රජයේ අයිතියට පත් නොවී එහි ප්‍රධාන කොටස් කරුවකු ලෙස පැමිණිලිකාර කර්තෘහට  අයිති විය හැකිව තිබුණි. මෙය පැමිණිලිකාර කර්තෘ විසින් ගන්නට තිබුණු නිවැරදි ව්‍යාපාර තීරණය වූ අතර, එම තීරණය පැමිණිලිකාර කර්තෘගේ තනි අයිතිය, බලය සහ කැමැත්ත මත කරන්නට තිබුණ නමුත්, රජයේ ඉල්ලීම් වලට අවනත වී රජය විසින්  බලපෑම් කළ පරිදි ක්‍රියා කරන ලද්දේ ජපන් රජය විසින් ශ්‍රී ලංකා රජයට කරන  පීඩන හමුවේය.

කර්තෘ විසින්, සමාජ දේශපාලන වශයෙන් බලවත් හා බලවත් පුද්ගලයන්ගේ  හැසිරීම් හා ක්‍රියාකරිත්වය සහ විශේෂයෙන්ම, ශ්‍රී ලංකා රජයේ ඇපකර මත, මෙම ජපන් සමාගම් විසින් ශ්‍රී ලංකා රජයට සහ එහි ජනතාවට සිදුකරන ලද දැවැන්ත වංචාව පිළිබඳ නඩු පැවරීමේදී ඔහුට මුහුණ දීමට සිදුවූ බාධක හා බලපෑම් පිළිබඳව සාක්ෂිමය ලේඛනයන් මගින් මහත්සේ විස්තරාත්මකව පෙන්වා දී.

නින්දිත කාර්යභාරයක් ඉටු කළ එවන් එක් පුද්ගලයෙකු වුයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ජනාධිපති නීතිඥ කේ.එන්. චොක්සි වූ අතර, ඔහු එවකට ජනාධිපති ආර්. ප්‍රේමදාසට එරෙහිව ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග ගේ මව වන හිටපු අගමැති සිරිමා බණ්ඩාරනායක විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර තිබූ ජනාධිපතිවරණ පෙත්සම් නඩුව වෙනුවෙන් පෙනී සිටි ඔහුගේ ජ්‍යෙෂ්ඨ නීතිඥවරයාද විය.

පාර්ලිමේන්තු මන්ත්‍රී ජනාධිපති නීතිඥ කේ.එන්. චොක්සි HDL සමාගමේ අධ්‍යක්ෂකවරයකු වූ අතර, කොළඹ දිසා අධිකරණය නඩුවේ ඔහු වැරදි කළ අධ්‍යක්ෂකවරයකු ලෙස නම්කර තිබු අතර, ඔහුගේ එම වැරදිසහගත ක්‍රියාවන් කොළඹ දිසා අධිකරණය විසින් හෙළා දැක ඇත. තවද එම ක්‍රියාවන් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ ඉදිරිපත් කරනු ලැබ ඇත. ඒ කිසිවක් නොසැලකිල්ලට ගෙන පසුව ජනාධිපති ආර්. ප්‍රේමදාසගේ අනුප්‍රාප්තිකයා වූ ජනාධිපති ඩී.බී. විජේතුංගගේ රජය විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ජනාධිපති නීතිඥ කේ.එන්. චොක්සිව ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු අමාත්‍යවරයා ලෙස පත්කරන ලදී.

විශේෂ ජනාධිපති කොමිසමේ විමර්ශන කටයුතු සිදු කිරීමෙන් පසු, අන් අය අතර, පාර්ලිමේන්තු මන්ත්‍රී ජනාධිපති නීතිඥ කේ.එන්. චොක්සිට ශ්‍රී ලංකා රජයට එරෙහිව සිදුකල වංචා හේතු මත චෝදනා පත්‍ර නිකුත් කරන ලදී.තවද නීතිඥවරුන්ගේ හැසිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණ රීති කෙරෙහි අවධානය යොමු කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රී ජනාධිපති නීතිඥ කේ.එන්. චොක්සිව හෙලා දකිමින් විවේචනය කරන ලද්දේ, ඔහු විසින් විශේෂ ජනාධිපති කොමිසම වෙත ඉදිරිපත් කළ ලිඛිත ඉදිරිපත් කිරීම් වල අසත්‍ය, වැරදි සහගත, බොරු ප්‍රකාශයන් කර ඇති බව හෙළිවීම හේතුවෙනි.

ඛේදජනක ලෙස, අගමැති රනිල් වික්‍රමසිංහ විසින් 2001 දෙසැම්බර් මාසයේ පැවති මහ මැතිවරණයෙන් ජයග්‍රහණය කිරීමෙන් පසු, උපහාසාත්මක ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී ජනාධිපති නීතිඥ කේ.එන්. චොක්සිව ශ්‍රී ලංකාවේ මුදල් අමාත්‍යවරයා ලෙස පත් කරන ලදී. ඒ අනුව බදු සමාවක් මුවාවෙන් පුදුම සහගත ඉමහත් පළල් දූෂ්‍ය සමාවක් නීතිගත කර බලාත්මක කිරීමෙන්, කතෘ එයට එරෙහිව මහජන මතයක් ගොඩනැගීමෙන් ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග විසින් කලින් කැඳවූ මහා මැතිවරණයකින් එකී මහජන මතය මත එවකට රජය පරාජය වීය.

කර්තෘගේ ඉල්ලීම පරිදි ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග විසින් පොදු සමා ආඥා පනත නිගමනයක් සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කළ අතර, ශ්‍රේෂ්ඨාධිකරණයේ පස් පුද්ගල විනිසුරු මඩුල්ලක් ඉදිරියේ විමසීමේදී, කර්තෘ පෞද්ගලිකව පෙනී සිටිමින්, ඉතාමත් දීර්ඝ විස්තර සහිතව කරුණු ඉදිරිපත් කරමින් එම පනත තරයේ හෙළා දැක්වූ අතර, ශ්‍රේෂ්ඨාධිකරණය

එය පිළිගනිමින් මෙසේ සදහන් කළේය - *'සාධාරණ නීතියට විරුද්ධවාදී බවත්, එය ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් ප්‍රඥප්තියට හා ජාත්‍යන්තර සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුතිය උල්ලංඝනය කිරීමක් සහ, මෙය රජයට විශාල ලෙස අලාභ සිදු කරමින් මහජන අදායම් වංචා කිරීමක් වේ'.*

හොදින් හා සත්‍ය ලෙසට නිරාවරණය කරුණු මත, හිතුවක්කාර හැසිරීම අනුව ක්‍රියා කළ තවත් අයෙකු වුයේ අධිකරණ අමාත්‍ය ජී.එල්. පිරිස්ය.මෙම බේරුම්කරණ ගිවිසුම් ඔහු විසින් කළා යයි ප්‍රශංසා ලබා ගත් අතර, පසුව එහි පෞද්ගලිකව ඔහුට අහිතකරව බලපාන අන්දමින් කොන්දේසිය පනවා තිබීම මත, ඔහු ඊට හාත්පසින්ම සම්පුර්ණයෙන් වෙනස් ස්ථාවරයක් ගෙන මෙම නිරවුල විවේචනය කර මහා ආන්දෝලනයක් ඇති කළ අතර, ඔහුගේ එම හිතුවක්කාර වැයම නිසා, තවදුරටත් HDL සමාගම මුල්‍ය වශයෙන් ප්‍රතිව්‍යුහගතකිරීමට නොහැකිවීමෙන්, HDL සමාගමට විශාල අලාභයක් හා හානියක් සිදුවී ඇත.

විචාරණ වලට පිළිතුරු නොදීමත්, ඔහුගේ බලය සහ පාලනය යටතේ පවත්වා ගෙන යන සහ තබා තිබුණු අදාළ ලිපි ගොනු වල සියලු ලේඛනයන් ඉදිරිපත් කිරීමට සමත් නොවීමත් මත, අධිකරණ අමාත්‍ය ජී.එල්. පීරිස්ට එරෙහිව කර් තෘ විසින් පැනවූ නඩු දෙකේ සමථයෙන් පසුව කර්තෘ විසින් කල්තැබීම කර අතහැර දමා තිබුණි.

විශේෂ ජනාධිපති කොමිසම ඉදිරියේ වැරදිකරුවන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගන්නා බවට ඉහත කී පරිදි මහජනතාව වෙත නිවේදනය කිරීමෙන් පසුව බේරුම්කරණයද නොතකා, ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ජනාධිපති නීතිඥ කේ.එන්. චොක්සිව ආරක්ෂා කිරිම සඳහා විශේෂ ජනාධිපති කොමිසමේ වරෙන්තුව දීර්ඝ නොකරන ලෙස ඉල්ලීම් කරන ලදී. ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග පසුව එළිදරව් කර තිබූ පරිදි අධිකරණ අමාත්‍ය ජී.එල්. පීරිස් විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ජනාධිපති නීතිඥ කේ.එන්. චොක්සිව රැගෙන විත් පොරොන්දු ලබා ගෙන තිබුණේ ඇය විසින් 2000 අගෝස්තු මස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන නව ව්‍යවස්ථාවට එවකට විපක්ෂය වූ එක්සත් ජාතික පක්ෂයේ සහාය ලබා දෙන බවටය. නමුත් එය එසේ නොවී විනාශකාරී තත්වයක් ඇතිවිය.

ඒ අනුව ඉන්පසුව වහාම හිල්ටන් හෝටලය ඉදිකිරීමේදී සිදුකල මෙම මහා පරිමාණ වංචාව පිළිබඳ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් විමර්ශනය කොට වැරදිකරුවන්ට එරෙහිව නීතිමය පියවර ගන්නා ලෙස, ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග විසින් පොලිස්පතිතුමාට නියෝග කර සිටින ලදී. මෙයද අක්‍රිය වීමෙන් පිළිඹිබු වන්නේ සමාජ-දේශපාලන බලපෑම් හා පීඩන මත එය එසේ වීමෙන් සමාජයේ යථාර්ථය පිළිඹිමු වීමකි.

තවත් ප්‍රකට පුද්ගලයෙකු වූ අභ්‍යන්තර කටයුතු අමාත්‍ය ජනාධිපති නීතිඥ ලක්ෂ්මන් කදිරගාමර් ප්‍රසිද්ධියේ ක්‍රියා කරමින් අනුශාසනා කර සිටිමින්, ශ්‍රී ලංකා රජයට සහ මහජනයාට සිදුකළ ඉහත කී මහා පරිමාණ වංචාව අවතක්සේරුවට ලක් කරමින් ‘හුදු ආරවුලක්’ සහ ‘හිසරදයක්’ බව පවසා, ජපානය සැනසීමට, ශ්‍රී ලංකාවේ මහජන අවශ්‍යතාවන්ට පවා ද්‍රෝහී ලෙස ක්‍රියාකර ශ්‍රී ලංකාවේ මහජන අයිතීන් පාවා දී ඇත. කර්තෘ විසින් මුහුණ දුන් කරුණු පුළුල් ලෙස ලිඛිතව ඔහු වෙත ඉදිරිපත් කළ අතර, එනමුත්, එම කරුණා ප්‍රතික්ෂේප සහ / හෝ වැරදි බව ඔප්පු කිරීමට නොහැකිව තුෂ්ණිම්භූත වී ඇත.

ජනාධිපති මහින්ද රාජපක්ෂ 2005 දී ජනාධිපති ධුරයට පත්වීමෙන් මෙම අපරාධ පරීක්ෂණ සම්බන්ධයෙන් නොදුටු සේ අන්ධභාවයකින් සිටියදීත්, ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග විසින් විශේෂයෙන්ම මේ සම්බන්ධයෙන් ගරු නීතිපති ජනාධිපති නීතිඥ සි.ආර්.ද සිල්වා වෙත විශේෂ අවධානය යොමු කරමින් ලිපියක් ඉදිරිපත් කර තිබුණද, එයින්ද කිසිදු අයුරක ක්‍රියාත්මක වීමක් සිදු නොවිය.

ජනාධිපති මහින්ද රාජපක්ෂ අපරීක්ෂාකාරී ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විරෝධී ඉතාමත් කඩි මුඩියේ පුද්ගල ආලම්භන නීතියක් මත HDL සමාගම රජයට පවරා ගනු ලැබුවේ එම හිල්ටන් හෝටලය අයිති HDL සමාගම රජයට රු. මි. 12,000 ක් ණය වී ඇති පදනම මත එය සිදු කරන බව කියමිනි. නමුත් එයින් රු. මි. 8000 ක් වැල් පොලිය මත වූ අතර, ඒ මත ප්‍රාග්ධනය ණය වූ රු.මි. 4000 ක් ඉක්මවා ගොස් තිබුණි.

HDL සමාගමේ මූල්‍ය වශයෙන් අසීරුතාවකට පත්වීමට හිටපු අධිකරණ අමාත්‍ය ජී.එල්. පීරිස් සහ අභියාචනාධිකරණ විනිසුරු සි.වී. විග්නේශ්වරන් සෘජුවම වගකිව යුතු සහ වග විය යුතු පුද්ගලයන් වන්නේ, අධිකරණ අමාත්‍ය ජී.එල්. පීරිස් මහජනයා අතර මහා වැරදි සහගත ආන්දෝලනයක් ඇති කරමින් කටයුතු කිරීම සහ, ඒ අනුව අභියාචනාධිකරණ විනිසුරු සි.වී. විග්නේශ්වරන් විසින් දුන් ප්‍රශ්නකාරී දූෂ්‍ය නියෝගයත් නිසාය.